VIDUS 19-2-2

# කතුවැකිය

ජාතියක් වශයෙන් ලාංකිකයන් සමන්විතව ඇත්තේ, බොහෝ සෙයින්ම, ගැමි ජනතාවගෙන් බව පිළිගත යුතුව ඇති සත්‍යයෙකි. මෙම ජනතාව අතුරින්, ගණන් ගතයුතු ප්‍රතිශතයක්ම, දියුණු උගැන්මක් ලැබීමට වාසනාව ලද්දන් නොවන බවත් පිළිගත යුතුමය. මෙසේ ශාස්ත්‍රීය ඌණතාවෙකින් පෙළෙන්නාවූ අප පොදු ජනතාව අතර මුල් බැස ඇති අවිද්‍යාත්මක මත හා,, මෝහය මූර්තිමත් කරන්නාවූ සංකල්පද බිඳහෙළීමයි, විද්‍යාත්මක අධ්‍යාපනයේ ආභාෂය ලද්දවූ අතලොස්ස මත පැවරී ඇති වැදගත්ම කාර්යය වනුයේ.

අවාසනාවකට මෙන්, අප අතර ඇති විද්‍යාඥයන් සමහරකු, ගැමි පිළිවෙතින් ඈත්වූ, ගැමියා නොහඳුනන, ග්‍රාමීය ප්‍රශ්න වලට අන්ධ වූවෝ වෙති. නවතම විද්‍යාත්මක ආකල්ප ව්‍යාප්තිය සඳහා සැරසෙන විද්‍යාඥයාට එරෙහිව නැගීමේ ස්වාභාවික ගතියක් බොහෝ ගැමියන් වෙත දක්නට ලැබෙනුයේ, සමහර විටෙක, ගැමියාත් විද්‍යාඥයාත් අතර ඇති මෙම පුළුල් පරතරයෙහි හේතුවෙන් වන්නට බැරි නැත.

මෙම අවාසනාවන්ත පරතරය ඇතිවීමට, විද්‍යාඥයාත් ගැමියාත් අතර ඇති සමාජයීය සහ ආර්ථික වෙනස්කම් බොහෝ දුරට පදනම් වේ. එමෙන්ම, අප මෙතෙක් ලද ඉංග්‍රීසි මාධ්‍යයීය අධ්‍යාපනයද මෙම පරතරය තවද පුළුල් කොට පවත්වා ගැනීමට ඉවහල් වූවා විය හැකි ය.

ලාංකික ගැමි ජනතාව අවිද්‍යාවෙන් මුදවා ගනු සඳහා අප විසින් කළ යුතුව ඇත්තේ ඔවුන් උපදින, හැදෙන-වැඩෙන පරිසරය වටහා ගැන්මයි. ඔවුන්ගේ වතපිළිවෙත හඳුනා ගැන්මයි; ඔවුන් මුහුණ පාන දෛනික ප්‍රශ්න වටහා ගැන්මයි; ඔවුන්ගේ සිතුම් පැතුම් තුළට කා වැදී, ක්‍රමයෙන් ඔවුන හට විද්‍යාත්මක මගෙන් ගත හැකි ඵල ඔප්පු කොට දැක්වීම යි.

අප රටෙහි විද්‍යාව ව්‍යාප්ත කිරීම පොතින් පතින් හෝ ගුවන් විදුලියෙන් සහ ප්‍රසිද්ධ දේශන මගින් හෝ පමණක් කළ හැක්කේ නොවේ. අප ගැමියා අතරට යා යුතුමය. අප සමහරුන් දැන් නැග ඉන්නා සමාජ කරලිය මතම හිඳ රඟපානු ලබන විද්‍යා-නාට්‍යය දැක්විය යුත්තේ, ප්‍රේක්ෂකයා මැදට ගොස්, ඔහුද එහි නළුවකු වශයෙන් බඳවා ගෙනැ යි.

විද්‍යාවෙන් තොර වූ ජාතික විමුක්තියක් අපට හෝ, ලොව අන් කවර වර්ගයකට හෝ ඇති වේ යැයි සිතනු නොවටී. එහෙත් විද්‍යාව ව්‍යාප්ත කරනු සඳහා ගන්නා පියවරෙහි දී නැගෙන හැකි දුෂ්කරතා මතින් ගොඩවීම සඳහා මෙම මූලධර්මය පමණක් යෙදීම නොසෑහේ. විද්‍යාවෙන් එදිනෙද ජීවිතයෙහි දී, ගතහැකි ඵලය මේ යැයි අප රටියාට වැටහුනේ කවර දිනෙක ද, එද විද්‍යා ව්‍යාප්තිය සඳහා ඔවුන්ද අප හා එක්ව ගමන් කරනු ඇත. එසේ කිරීමට නම්, ගතින් පමණක් නොව සිතින් ද අප ඔවුන් හෝ සබැඳිය යුතු ම ය.

**දෙස්තර නන්දදස කෝදගොඩගෙනි**

**වසර 1970 දී " විද්‍යා " සඟරාවට**
**මහාචාර්ය නන්දදස කෝදගොඩ විද්වතුන් විසින් ලියන ලද මෙම**
**කතුවැකිය එතුමාට ගෞරව පිණිස මෙසේ පළ කරමු.**

VIDUS 19-2-3

# මහාචාර්ය කෝදගොඩ සහ නරේසා ආයතනය


මහාචාර්ය ප්‍රියානි ඒ සොයිසා

සභාපති

ජාතික විද්‍යා පදනම


නන්දදස කෝදගොඩ මහාචාර්ය තුමන් හා මාත් අතර කොළඹ වෛද්‍ය පීඨය තුළදී ගොඩනැගුණු සුහදශීලී මිත්‍රත්වය දශක දෙකහමාරක අධ්‍යයන කාල අතීතයකට හිමිකම් කියයි. එවකට ඔහු කොළඹ වෛද්‍ය පීඨයේ වෝහාරික වෛද්‍ය අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය වරයෙක් විය. ප්‍රේමදස උඩුගම මහතාගේ ඇරයුමකට අනුව අප විසින් පෙර පාසැල් දරුවන් යන ග්‍රන්ථය රචනා කරන ලද්දේ එම විෂය ක්ෂේත්‍රය පිළිබඳ මට තිබුණු විශේෂඥ දැනුම මෙන්ම නන්දදස කෝදගොඩ මහාචාර්යතුමාගේ සිංහල භාෂාව පිළිබඳව තිබුණු නිපුණත්වය නිසාය.

වසර 1992 දී එවකට කර්මාන්ත හා විද්‍යා කටයුතු පිළිබඳව ගරු ඇමතිව සිටි රනිල් වික්‍රමසිංහ මහතා විසින් අනෙකුත් සාමාජිකයන් සමග පත් කරන ලද ශ්‍රී ලංකා ස්වාභාවික සම්පත්, බලශක්ති හා විද්‍යා අධිකාරියේ (නරේසා) පාලක මණ්ඩලයේ, පාලක සභා තුනක මෙතුමා සේවය කරන ලදී. එතැන් පටන් වසර 1992 සිට විද්‍යා අධ්‍යාපන ක්‍රියාකාරී කමිටුවේ සභාපති ලෙසද කටයුතු කළේය. නරේසා ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් සහ සභාපති ලෙස මා කටයුතු කළ අවධියේ දී එතුමා සතුව තිබුණු කාර්ය ශක්තිය හැකි උපරිම අන්දමින් මා හට ලබාදීමට පසුබට වූයේ නැත. පසුව වසර 1994 දී ගරු බර්නාඩ් සොයිසා අමාත්‍යතුමා වශයෙන් විද්‍යා හා තාක්ෂණික අමාත්‍යාංශයට කැබිනට් නිලයක් ලබාදුන් අවස්ථාවේදී නැවත වරක් එතුමාව පාලක සභාවට පත් කෙරිණි. වසර 1997 දීත් ගරු බර්නාඩ් සොයිසා අමාත්‍යතුමා විසින් නැවත වරක් කෝදගොඩ මහාචාර්ය තුමාව නරේසා පාලක මණ්ඩලයට පත්කර ගනු ලැබීමෙන් පසුව මිය යන තුරුම ඔහු අප ආයතනයට පාලක සභාවේ සාමාජිකයෙකු වශයෙන් වටිනා සේවයක් සළසා දුන්නේය. එහි කටයුතු සඳහා මහාචාර්ය කෝදගොඩගේ දයකත්වය සත්‍ය වශයෙන්ම ආලෝකයක් විය. එසේ වූයේ පරිපාලකයෙකු ලෙස කොළඹ විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨයේ වෝහාරික වෛද්‍ය විද්‍යා අංශයේ ප්‍රධානියා ලෙසත්, වෛද්‍ය පීඨයේ පීඨාධිපති මෙන්ම උප කුලපති ලෙසත් කටයුතු කිරීමෙන් ලබාගත් ඔහුටම ආවේනික වූ විද්‍යාත්මක පසුබිම සහ අත්දැකීම් නිසාය. ඔහු සතුව තිබුණු අනෙක් පලපුරුදු වූයේ රාජ්‍ය නොවන සංවිධාන සමග සේවය කිරීමයි. මේ සියලු ගුණාංගයන් හා අත්දැකීම් පාලක මණ්ඩලය තුළ එතුමාව සුවිශේෂ පුද්ගලයෙකු කළේය. බඳවා ගැනීම්. 1994 දී නරේසා ආයතනය "ජාතික විද්‍යා පදනම" ලෙස වෙනස් කළ යුතුයයි සලකා බැලූ කාලයේදීත් උසස්වීම් සහ වැටුප් පුණරීක්ෂණ වැනි බොහෝ උපකමිටු වලදී ප්‍රථමයෙන් ඔහු ක්‍රියාකාරීව සිටි අතර කාර්ය මණ්ඩල වෙනස් කිරීම හා පත්වීම් ශ්‍රේණිගත කිරීම වැනි දේ ඔහු ගේ සැලකිල්ලට භාජනය විය. අනෙකුත් උපකමිටු වලදීත් ඉතා උනන්දුවෙන් හා කැමැත්තෙන් කටයුතු කළ අතර ඔහුට තිබුණ නීතිය පිළිබඳ දැනුම නිසා සෝදිසි නිලධාරියෙකුද විය. පරිපාලන හැකියාවන්ට අමතරව ඔහුගේ තීන්දු සත්‍යවශයෙන්ම ප්‍රඥාවන්ත වූ අතර ඔහු ඉදිරිපත් කළ නම්‍යවූ සාධාරණ මානුෂික තීන්දු සාම්ප්‍රදායික නිලධාරී පරිපාලනයට ආදර්ශයක් විය.


පරිපාලන හැකියාවන්ට අමතරව ඔහුගේ තීන්දු සත්‍ය වශයෙන්ම ප්‍රඥාවන්ත වූ අතර ඔහු ඉදිරිපත් කළ නම්‍යවූ සාධාරණ මානුෂික තීන්දු සාම්ප්‍රදායික නිලධාරී පරිපාලනයට ආදර්ශයක් විය.


හිටපු විද්‍යා හා තාක්ෂණ ඇමති බර්නාඩ් සොයිසා මහතාට ඉදිරිපත් කළ විද්‍යා හා තාක්ෂණික කටයුතු පිළිබඳ ප්‍රතිපත්ති හා ක්‍රියාකාරී සැලැස්ම මුදුන් පමුණුවා ගැනීමේදී

පාලක මණ්ඩල කටයුතු වලට එතුමා ප්‍රබෝධමත් සම්පතක් විය. අතිගරු ජනාධිපතිනිය මෙය අනුමත කළ අවස්ථාවේදිද ඔහු අප අතර විය. අතිගරු ජනාධිපතිනියගේ ඉල්ලීමට අනුව මහජනයා අතර මෙම සැලැස්ම ජනප්‍රිය කරවීමේ අවශ්‍යතාවට දිවංගත ගරු බර්නාඩ් සොයිසා ඇමතිතුමා එකඟ විය. ඒ සඳහා සිංහලෙන් පිටපතක් සකස් කළත් අවාසනාවකට මෙන් එහි අවසන් ජේදය ලියා නිම කිරීමටත් පෙර කෝදගොඩ මහාචාර්යතුමා දැඩි ලෙස රෝගාතුර විය. එතුමාගේ වියෝවෙන් දුකට පත් පවුල වෙනුවෙන් ශෝක පණිවිඩයක් යැවීම් වස් නරේසා ආයතනයේ පාලක මණ්ඩලය මෙවැනි සමරු කලාපයක් එතුමා වෙනුවෙන් පල කිරීමේ අවශ්‍යතාවය මතු කළ අතර විද්‍යා අධ්‍යාපන කමිටුවට එම කටයුත්ත බාරදෙන ලදි. එතුමා නරේසා ආයතනයෙන් පිටතදී සිය දැනුම හා පලපුරුද්ද දයක කල ආකාරය ඒ ඒ ලිපිවල කතුවරුන් විසින් යෝග්‍ය වන පරිදි දක්වා ඇති අතර මෙම ලිපියෙහි තිබෙන අඩුපාඩු එම ලිපි වලින් පිරිමැසේ. ජීවිතයෙන් අත්මිදුණු ඔහු, සාමයෙන් හා තෘප්තියෙන් යුතුව නිර්වාණය දක්වා ඉදිරියට යාම අපගේ ප්‍රාර්ථනයයි.



සංගීතය පිළිබඳව හසළ දැනුමක් තිබුණු එතුමා පරිහරණය කළ සර්පිනාව සහ වයලීනය



විශ්ව ප්‍රසාදිනී සම්මානය

VIDUS 19-2-5

# සිංහල බසින් විද්‍යාව

මහාචාර්ය ලක්ෂමන් වෛද්‍යසේකර

සිංහල බස සිංහලයෙක් ලෙස හදරා, විද්‍යාව ව්‍යාප්ත කිරීම සඳහා උපයෝගී කරගත් විශාරදයෙකි. අප අතරින් නොබෝද වෙන්වී ගිය නන්දදස කෝදගොඩ මහ ඇදුරුතුමා. එතුමා වෙනුවෙන් නිකුත් කෙරෙන "විදුරාව" සැමරුම් කලාපයට ලිපියක් සැපයීමට කරන ලද ආරාධනය අනුව මා තෝරාගත් මාතෘකාව නම් "සිංහල බසින් විද්‍යාව" යන්නයි. විද්‍යාව සිංහල බසින් ඉගැන්වීම ගැන දිරි වැඩුමක් සිදුවූයේ 50 දශකයේ මුල් කාලයේ දීය. අප දරුවන්ට විද්‍යාව ගැන පූර්ණ අවබෝධයක් ලබා ගැනීමට නොහැකි වූයේ විද්‍යා දැනුම සිංහල බසින් හැදෑරීමට නොලැබීමය. එයට [illegible] සහ බාධක රුසකි. එකක් හෙළ බසට ලැදියාවක නැති ඉංග්‍රීසි බසින් පමණක් විද්‍යාව ඉගෙන ගත් විද්වතුන් සිටීමයි. අනික විද්‍යාව සහ විද්‍යාත්මක අදහස් සිංහල හෝ ස්වභාෂාවෙන් ඇත්වූ දෙයක් ලෙස හැඳින ගැනීමයි. තවත් කරුණක් නම් සිංහලෙන් ලියවුණු පොත්පත් ලිපි ලේඛන අඩු වීමයි. විශ්ව විද්‍යාල විද්‍යා අධ්‍යාපනය එවකට ඉංග්‍රීසි භාෂාවට පමණක් සීමාවීමක් එක් හේතුවකි. පිරිවෙන් විශ්ව විද්‍යාල යයි එකල නම් කෙරුණු විද්‍යෝදය, විද්‍යාලංකාරය යන විශ්ව විද්‍යාල බිහිවීම විශ්ව විද්‍යාල අධ්‍යාපනයෙහි විද්‍යාව සිංහලෙන් ඉගැන්වීමට ගත් සාර්ථක වැඩපිළිවෙලක ආරම්භය විය. මේ සමගම විද්‍යාව විෂයයක් හැටියට ද්විතීයික අධ්‍යාපනයට ඇතුලත් කිරීම විද්‍යාව සිංහල බසින් ඉගැන්වීමේ ආරම්භයද විය.

මෙම යුගයේ සිංහලය රාජ්‍ය භාෂාව ලෙස පිළිගැනීමත් සමග රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවක් ද ආරම්භ කරන ලදී. වසර 1956 දී රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ ප්‍රකාශන අංශයක් ආරම්භ කර එමගින් විද්‍යා පරිභාෂිත ශබ්ද නැතහොත් සිංහලෙන් විද්‍යා වචන සකස් කිරීමද ආරම්භ විය. අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයට සූදනම් වන සිසුනට අවශ්‍ය වචනත් විද්‍යාව හදරන සහ සිංහලෙන් කියවා විද්‍යාව දැන ගැනීමට ආශාවෙන් සිටින අයට දැනුම වැඩිකර ගැනීමට අවශ්‍ය වචන තිබීමත් ඉන් පිටුවහලක් විය. පසු කලෙක කුඩා පොත් වශයෙන්ද පාරිභාෂිත ශබ්ද ඇතුලත් දේ ප්‍රසිද්ධ කරන ලදී. පාරිභාෂිත සමහර වචන සිංහලයට නුහුරු වුවත් මේ නිසා විද්‍යා දැනුමේ ව්‍යාප්තිය දියුණු වන්නට විය. සිංහලෙන් දැනුම සොයා යන අයට සහ පරිවර්තන වලට අත්වැලක් විය.

ආසියාතික රටවල ස්වභාෂාවෙන් විද්‍යාව ඉගෙනුම හා අදහස් ප්‍රකාශ කිරීම අපට වඩා දියුණු විය. තවද අපට වඩා පැරණිද විය. ඉන්දියාවේ සෑම ප්‍රාන්තයකම ප්‍රාන්ත භාෂාවෙන් දැනුම දියුණු කිරීම කලක සිට සිදුවූවකි. හිංදි භාෂාව රාජ්‍ය භාෂාව වුවත් බටහිර බෙංගාලයේ වංග භාෂාවත් දකුණු ඉංදියාවේ දෙමළ භාෂාවත් අනෙකුත් ප්‍රාන්තවල ප්‍රාන්ත භාෂා වලිනුත් විද්‍යා දැනුම දියුණු විය. අග්නිදිග ආසියාතික රටවලද එසේම විය. චීන ජාතිකයන් දෙස බැලුවත් දියුණුව ඉමහත්ය ජපානයේ අය විද්‍යා අධ්‍යාපනය ජපන් භාෂාවට පමණක් සීමාකර එහි දක්ෂතාව අනුව සෑම විද්‍යා පර්යේෂණ පත්‍රිකාවක්ම පළමුවෙන් එම භාෂාවෙනුත් දෙවනුව ඒවා ඉංග්‍රීසි හා අනෙකුත් භාෂා වලටත් පරිවර්තනය කරනු ලබයි.

> **50 දශකයේ මුල් යුගයේදී අප දරුවන්ට විද්‍යාව සිංහල බසින් හැදෑරීමට අවස්ථාව ලැබුනේ නැත. මෙයට හේතුන් දෙකකි. පලමුවැන්න හෙළබසට ලැදියාවක් නැති ඉංග්‍රීසි බසින් විද්‍යාව උගත් විද්වතුන් සිටීමයි. දෙවැන්න විද්‍යාව සහ විද්‍යාත්මක අදහස් සිංහල භාෂාවෙන් ඇත්වූ දෙයක් ලෙස සැලකීමයි.**

සිංහලයන් සිංහලෙන් විද්‍යා අදහස් ලබාගැනීම පමා වුවත් පටන්ගත් දින සිට සමහර අවස්ථාවලදී වුවත් පසුව එය දියුණු විය. විද්‍යාව සාමාන්‍යයෙන් ගැමි ජනතාව අතර ප්‍රචලිත කිරීමේ වැඩපිළිවෙවල්ද මෙයට උපකාරී විය. එහෙත් පොත්පත් ලිවීම හා ප්‍රසිද්ධ කිරීමට ගත් පරිශ්‍රම අඩුය. එයට හේතුව විශ්වවිද්‍යාල අධ්‍යාපනය තුළට එය ඇතුලත් කිරීම ප්‍රමාද වීමයි.

විශ්වවිද්‍යාල අධ්‍යාපනය හා ස්වභාෂාව යන මැයෙන් මම කරුණු රුසක් විද්‍යෝදය සරසවිය සභරාවට 1969 දී ඉදිරිපත් කළෙමි. එද මා කියා සිටියේ අප රටෙහි විද්‍යා අධ්‍යාපනය තවමත් නොසන්සුන් තත්ත්වයක ඇති බවය. විශ්ව විද්‍යාල අධ්‍යාපනය ලබාගත් අයගෙන් පිටරට ගොස් වැඩිදුර පුහුණුව ලැබූ අය සිංහලට ඇති ඇල්ම අඩුවීමය.

අනෙක වැඩිදුර ඉගෙනුම නොලත් අය ගුරු වෘත්තියට ඇතුලත් වන්නේ විද්‍යා අධ්‍යාපනයේ ඇති අදූරදර්ශී ක්‍රියා කලාපය සමගය. පාසැල් විද්‍යා අධ්‍යාපනයේ නිර්දේශ දිනෙන් දින උසස්කර මූලික අදහස් කොන් කිරීම තවත් හේතුවක් විය.

අප ගතයුතු මගනම් ලෝකයේ අනෙකුත් විශ්ව විද්‍යාල මෙන් අපද දෙසට ඔබින මූලික මූලධර්ම මත ගොඩ නැගුණු අධ්‍යාපනයක් බවට පෙරලීමය. සිංහලෙන් විද්‍යාව ඉගැන්වීම ආරම්භ කල වකවානුවේ සිට විද්‍යා අධ්‍යාපනයේ දියුණුව ආරම්භවී උසස් අධ්‍යාපන ක්ෂෙත්‍රයට පිවිසීමෙන් පසු තවත් දියුණුවක් ඇති විය. විද්‍යෝදය, විද්‍යාලංකාර යන විශ්ව විද්‍යාල වලින් එයට මහත් සේවයක් ඇතිවිය. මෙම විශ්ව විද්‍යාලවල විද්‍යා පීඨ ආරම්භයේ සිටම එයට කැපවූ ආචාර්ය මඩුල්ල විද්‍යාව සිංහලෙන් ඉගැන්වීමට කැපවූ අයයි. ඒ අයුරුම ස්වභාෂාවෙන් විද්‍යාව හැදෑරීමට කැමැත්ත දැක්වූ සිසු පිරිසක්ද එයට එක්වී සහයෝගයක් දැක්විය. ගැමි දරුවනට නව දෙරක් විවෘත විය. පිටිසර යයි සලකන ප්‍රදේශවල දරුවනට සහනයක්ද විය. ඔවුන්ගේ විද්‍යා දැනුම දියුණු වන්නට විය. 60 දශකයේ පටන්ගත් මෙම ක්‍රියාවෙන් 70 දශකයට පිවිසෙත්ම සිංහලෙන් විද්‍යා දැනුම දියුණු කරගත් උපාධිධරයන් රාශියක් බිහිවිය. එපමනක්ද නොව ඔවුන්ගේ පශ්චාත් උපාධි පර්යේෂණ වලට ලොව පිළිගත් ජ්වා තරමට උසස් තැනක්ද අයත් විය. එම යුගයේදී ආරම්භවූ මෙම ස්වභාෂා විද්‍යා අධ්‍යාපන රැල්ල අවසන් වූයේ අදත් උසස් ස්ථානවල සිටින පර්යේෂණ ආයතන අධ්‍යක්ෂවරු ආචාර්ය, මහාචාර්යවරු ඇති වීමෙනි. විද්‍යෝදය හා විද්‍යාලංකාර මෙන්ම ශ්‍රී ලංකාවේ අනෙකුත් විශ්ව විදයාල වලද සිංහලෙන් විද්‍යාව යන්නට ලැබුණේ උසස් තැනක් නිසා මූලික විද්‍යා අධයාපනයට අඩිතාලමක් ලෙස සිංහලෙන් විද්‍යාව පිවිසි පසු ලෝකයේ අනෙකුත් භාෂා වලින් විද්‍යාවට හිමි තැන මෙන් තැනක් අප රටෙහිද සිංහල බසින් විද්‍යාවට ලැබිණ.

ජාතියක් වශයෙන් නැගී සිටීමට ඉවහල් වන මුල්ම දෙය භාෂාවයි. භාෂාව, ජනිතවන සෑම මිනිහෙක්ම ජන්මයෙන් ගෙන එන දෙයකි. කතා කිරීම මෙන්ම සිතිවිලිද චින්තනයද එම භාෂාවටම සීමාවී ඇත. අප ලියන කියන සෑම දෙයක්ම චින්තන ශක්තියෙන් උපදින්නකි. වරක් අපට මුනගැසුණු ජපන් මහාචාර්ය වරයෙක් පැවසුවේ අප සිතන්නේත්, ජපන් භාෂාවෙනි. අප ලියන්නේත්, කියන්නේත් ජපන් වලිනි. අපේ නියම ප්‍රථිපල ලැබෙන්නට නම් ජපන්ම අවශ්‍යය. විද්‍යාව හා තාක්ෂණයේ පෙරමුණ ගත් එවැනි රටක් නිදසුනක්ය. දශක පහකට තරම් වූ කාලයක් අනෙකුත් සෑම දෙයක් මෙන්ම විද්‍යාවත් ගමන්ගත් මගට පිවිසුණු සාර්ථකත්වය සිංහලයේ සිංහලයෙක් ලෙස උපන් සිංහල සිතිවිලි ඒකරාශී කරගෙන අපේ චින්තන ශක්තිය විසින්ම දියුණු වීමෙනි. "සිංහල බසින් විද්‍යාව" පෙරමුණට පිවිස ඇත්තේ මෙම යුගයේ ප්‍රථිපලයක් ලෙසටය.



**පාසැලක විද්‍යා දිනයකදී සිසුන් සමග සුහද හමුවක්**

(ජායාරූපයේ මැද මහාචාර්ය පී.එල්.ඩී. වෛද්‍යසේකර, දකුණු කෙලවර මහාචාර්ය නන්දදස කෝදගොඩ)

VIDU 519-2-7

## මහාචාර්ය නන්දදාස කෝදාගොඩ

# විද්‍යාව ජනප්‍රිය කිරීමේදී ඉටු කළ මෙහෙය

ආචාර්ය උපාලි එම්. සේනානායක
කාර්මික තාක්ෂණික ආයතනය
කොළඹ 07.

මහාචාර්ය නන්දදාස කෝදාගොඩ මට පළමු වතාවට මුණගැසුනේ වර්ෂ 1967 ජූනි මාසයේ දිනකය. එය කොළඹ ආසන්නයේ පිහිටි පාසැලක විද්‍යා දිනයක් විය. එද එහි දේශන පැවැත්වූ දේශකයන් අතර දෙස්තර නන්දදාස කෝදාගොඩද විය. බොහෝ දේශකයන්ගේ විද්‍යා දේශන මා අසා ඇති නමුත් දෙස්තර කෝදාගොඩ ගේ දේශනයෙහි විශේෂ අමුත්තක් විය. එය හරබර මෙන්ම සරල ද විය. එහෙයින්ම එය තේරුම් ගැනීමටද පහසු විය. එම දිනට පෙර දෙස්තර කෝදාගොඩ ගේ විද්‍යා ලිපි සහ ගුවන් විදුලි කතා මා අසා ඇති නමුත් එම පුද්ගලයා ඇස හමුවේ දැකීම තරමක සතුට දනවන එකක් විය. එද දෙස්තර කෝදාගොඩ මහතා ඇඳ සිටියේ ජාතික ඇඳුමයි. මෙය එක් අතකට ආචාර්ය අදිකාරම් සිහියට නංවන්නක් විය. මාද විද්‍යා ලිපි ලියන ලේඛකයෙක් වූ හෙයින් එද අප දෙදෙනා හමුවීම දීර්ඝ සම්බන්ධතාවයකට කදිම ආරම්භයක් විය.

එවකට ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමයේ විද්‍යා ව්‍යාප්ති කමිටුවේ සභාපති ලෙස කටයුතු කළේ දෙස්තර නන්දදාස කෝදාගොඩ මහතාය එතුමාගේ යෝජනාවක් අනුව එම කමිටුවේ සාමාජිකයෙකු ලෙස මා අනුයුක්ත කරගනු ලැබීය. එද සිට දිවංගත වූ දින දක්වා එම විද්‍යා ව්‍යාප්ත කමිටුවේ ක්‍රියාකාරී සාමාජිකයෙක් ලෙස මහාචාර්ය නන්දදාස කෝදාගොඩ මහතා ක්‍රියා කළේය.

විද්‍යාව ජනප්‍රිය කිරීම සඳහා මහාචාර්ය නන්දදාස කෝදාගොඩ කීප අංශයකින්ම කටයුතු කළේය. ප්‍රසිද්ධ පුවත්පත් වලට විද්‍යා ලිපි ලිවීම, ගුවන් විදුලි විද්‍යා සාකච්ඡාව, බටහිර වෛද්‍ය සාකච්ඡාව, පාසල් ළමුන් සහ මහජනයා සහභාගි වන විද්‍යා දේශන සහ සම්මන්ත්‍රණ, විද්‍යා දැනුම මිනුම වැඩසටහන් සහ රූපවාහිණී වැඩසටහන් ඉන් කිහිපයකි. විද්‍යා මාධ්‍යයෙන් එතුමා කළ විද්‍යාව ජනප්‍රිය කිරීමේ වැඩ කටයුතු වෙනත් ලිපියකින් ආවරණය වන හෙයින් මෙම ලිපිය ලිඛිත හා වාචික මාධ්‍යයට පමණක් සීමා කරමි.

ප්‍රසිද්ධ පුවත්පත් වලට වඩා ජනප්‍රිය විද්‍යා ලිපි සැපයීමට අමතරව මහාචාර්ය කෝදගොඩ විද්‍යා සඟරා ගණනාවකම සංස්කාරක සහ උපදේශක ලෙස සේවය කරන ලදී. ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමයේ විද්‍යාව ජනප්‍රිය කිරීමේ කමිටුව පළ කරන විද්‍යා ව්‍යාප්ති සඟරාවත්, නරේසා ආයතනය පළ කරන විදුරාව සඟරාවත් මෙහිදී උදාහරණ ලෙස දැක්විය හැක. මෙම සඟරාවල පැවතීම සඳහා කාලෝචිත මෙන්ම සරල බසින් ලියවුනු විද්‍යා ලිපි අවශ්‍යය. විද්‍යා ශිෂ්‍යයින් පමණක් නොව සාමාන්‍ය මහජනතාවත් මෙම සඟරා කියවන හෙයින් ඒවා තේරුම්ගත හැකි බසින් ලිවීම වැදගත්ය. විද්‍යා ව්‍යාප්ති සහ විදුරාව විද්‍යා සඟරා දෙකෙහි පළ කරන ලද බොහෝ ලිපි, ඒවා පළ කිරීමට පෙර මහාචාර්ය කෝදගොඩගේ නිරීක්ෂණයට ලක් විය. මෙයට හේතු දෙකක් විය. එතුමාගේ විද්‍යා දැනුම විෂය පුළුල් විය. වෛද්‍ය විද්‍යාව ගැඹුරෙනුත්, අන්‍ය විද්‍යා විෂයයන් පිළිබඳ සෑහෙන මට්ටමකද දැනුමක් එතුමාට තිබිණි. මේ නිසා ලේඛකයා අතින් සිදුවූන යම් යම් අඩුපාඩු හෝ වැරදි නිවැරදි කිරීමට එතුමාට හැකිවිය. හෙළ බස ගැන මනා දැනුමක් තිබුණ අතර ව්‍යාකරණ දෝෂ නිවැරදි කිරීමටද එතුමාට හැකියාවත් තිබිණි.

> මහාචාර්ය කෝදගොඩගේ කථා විලාශය සහ දේශන විලාශය සිත් ඇද ගන්නා සුළු විය. එය අසා සිටීම එක්තරා වින්දනයක් විය. වචනවල නියම උච්චාරණයත් හා අවධාරණය කළ යුතු තැන් ශබ්ද නගා කීමත්, එහි විශේෂ ලක්ෂණයක් විය.

මහාචාර්ය කෝදගොඩගේ කථා විලාශය සහ දේශන විලාශය සිත් ඇදගන්නා සුළු විය. එය අසා සිටීම එක්තරා වින්දනයක් විය. වචන වල නියම උච්චාරණයත්, අවධාරනය

කළ යුතු තැන ශබ්ද නගා කීමත් එහි විශේෂ ලක්ෂණයක් විය. මේ නිසාම බොහෝ කථිකයන් මහාචාර්ය කෝදගොඩගේ කථා සහ දේශන විලාශය අනුකරණය කිරීමටද පෙළඹුනහ.



විද්‍යාව ජනප්‍රිය කිරීමේ කමිටුව දිවයින පුරා විද්‍යා දේශන, විද්‍යා දින, පවත්වා ඇත. මේවා විශේෂයෙන් පාසැල් ශිෂ්‍යයින් සඳහා එල්ල වුවද, ප්‍රසිද්ධ විද්‍යා දේශන මහජනතාව කරා යොමු වූ එකක් විය. දිවයිනේ ඒ ඒ කොටස්වල විද්‍යා ශිෂ්‍යයින් සඳහා පවත්වන ලද විද්‍යා දින ඇතැම් අයගේ සිහිවටන විය. මක්නිසාද යත්, මහාචාර්ය නන්දදස කෝදගොඩගේ දේශනයක ජීවමාන කථිකයා පෙනී සිටීම විශේෂ අවස්ථාවක් විය. විද්‍යා දිනයකට මහාචාර්ය නන්දදස කෝදගොඩ සහභාගි වන විට ඒ ගැන ප්‍රසිද්ධියක් ලබා දෙන්නේ, දේශන පැවැත්වීමට සති ගණනකට පෙර සිටය. දේශනය කිරීමට ශාලාවට පැමිණෙන විට පිළිගන්නේ මල් මාලා දමාය. දේශන ශාලාව පිරී අසන්නන් සැහෙන සංඛ්‍යාවක් ශාලාව පිටතින් දක්නට ලැබීම සුලබ දෙයකි.

වර්ෂ 1980 දශකය පුරාම විද්‍යාව ජනප්‍රිය කරවීමේ කමිටු සාමාජිකයෙකු ලෙස එතුමා දිවයිනේ බොහෝ පෙදෙස්වල විද්‍යා දිනවලට සහභාගි විය. මෙම පෙදෙස් විද්‍යා දැනුම ලබා ගැනීමට පහසුකම් අඩු පෙදෙස් විය. එතුමා සමග විද්‍යා දින වැඩසටහන් වලට සහභාගි වීමට මටද හැකියාවක් ලැබිණි. දේශනයකින් යම් දැනුමක් ලබා දුන්නේ නම් ඒ ගැන පදනම් ප්‍රශ්න සාකච්ඡාවේදී ඊටත් වඩා දැනුමක් ලබාදීමට හැකි විය.

මහාචාර්ය කෝදගොඩ විද්‍යා ජනප්‍රිය කරවීමට ගත් තවත් වැදගත් පියවර කීපයක්ද මෙහි සඳහන් කළ යුතුය. මින් එකක් මහජනයා දැනුවත් කිරීමට ගත් පියවරකි. නරේසා ආයතනය මගින් "මහජනයා දැනුවත් කිරීමේ" වැඩ සටහන මින් එකකි. ඇතැම් ආයතනවල ඉල්ලීම පරිදි දිවා කෑම පැය තුළ හෝ විශේෂ ජනකායක් ඉදිරිපිට මෙම දේශන පවත්වන ලදී. ආහාර සහ පෝෂණය, ප්‍රථමාධාර, ඒඩ්ස් රෝගය සහ සමාජ ප්‍රශ්න, ගැබිණි මව්වරුන්ගේ පෝෂණය, දුම්පානය, මත්ද්‍රව්‍ය උවදුර ආදිය මෙම දේශන වලට මාතෘකා කොට ගන්නා ලදී.

මත් උවදුරෙන් වන හානි පිළිබඳව, එතුමාට වඩා මහජනයා දැනුවත් කළ පුද්ගලයෙකු ගැන මට සිතිය නොහැක. මෙම විෂය පාසැල් ශිෂ්‍යයින් සඳහා විශේෂයෙන් ඉලක්ක කරගත් අතර, පොලිස් නිලධාරීන් සහ ත්‍රිවිධ හමුදා සේනා සඳහා නීති දේශන මහාචාර්ය කෝදගොඩ පැවැත්වීය. මත් වැටියෙන් සහ මත් උවදුරෙන් වන හානිය ලාංකික ජනතාව දැනුවත් කිරීමට ගත් වෑයම ගැන මෙහිදී විශේෂයෙන් සඳහන් කළ යුතුය. එතුමාගේ සති අන්තය ගෙවුනේ ඈත පිටිසර ජනයාට මෙවන් දැනුමක් ලබා දීමෙනි. මීට අදාළ ප්‍රති-මත්ද්‍රව්‍ය පිළිබඳ සංගම්වල ක්‍රියාකාරී සාමාජිකත්වය එතුමා දරණ ලදී.

පළිබෝධ නාශක සහ කෘෂි රසායන පිළිබඳව පාසැල් සිසුන් සහ මහජනයා දැනුවත් කිරීමට ගත් පියවරද, විද්‍යාව ජනප්‍රිය කරවීමේ එක් අංගයක් විය. නිරාවරණ සිරුරක් ඇත්තෙකු කෘෂි රසායන ඉසින රූප රාමු රූපවාහිනියෙන් පෙන්වූ විට ඒවා නිවැරදි කර, කෘෂි රසායන ඉසින නියම ක්‍රමය ගැන දැනුවත් කිරීමට පළමු පියවර ගත්තේ එතුමාය.

විද්‍යාව ජනප්‍රිය කිරීමේ එක් කාර්ය භාරයක් වූයේද පළිබෝධ නාශක සහ කෘෂි රසායන භාවිතය ගැන නිවැරදි අවබෝධයක් පාසැල් සිසුන්ට ලබාදීමය. මෙම කාර්යයට මුල්තැන දී කටයුතු කළේ මහාචාර්ය කෝදගොඩය. පළිබෝධ නාශක අනතුරු නිසා අකාලයේ මිය යන අය ගැන කම්පාවෙන් කථා කළ එතුමා, එම භාවිතය නිවැරදි කිරීමට, එක් මාධ්‍යයක් ලෙස පාසැල් ළමුන් දැනුවත් කිරීමට පියවර ගත්තේය. දිවයිනේ විවිධ පාසැල් වලින්, විශේෂයෙන් කෘෂි රසායන වැඩියෙන් භාවිතා කරන ප්‍රදේශවල පාසැල් දරු දැරියන් තෝරා ඒ අයට දින තුනක වැඩමුළු ගන්නොරුව කෘෂි පර්යේෂණ මධ්‍යස්ථානයේ පැවැත්වීමට කටයුතු කළේය. දින තුනක පාඨමාලාවට එම පර්යේෂණ ආයතනයේ උපදේශකයින් ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වීමත් විශේෂ කරුණකි. ආදර්ශ සහ චිත්‍රපට මගින් වඩා උසස් අධ්‍යාපනයක් පාසැල් දරුවන්ට ලැබුණි. කෘෂි රසායන නිසා සිදුවන මරණ සංඛ්‍යාව පැහැදිලි පහත වැටීමක් විය. මෙම වැඩසටහන

කොතරම් ජනප්‍රිය වීද යත්. මහාචාර්ය කෝදගොඩ සමග දින තුනක් ගත කිරීමේ වැඩමුළු වලට පාසැල් සිසුන් සහභාගි වීම වාර්ෂිකව විශේෂ සිදුවීමක් විය.

විද්‍යාව ජනප්‍රිය කරවීමේ වැඩ කටයුතු වලදී මහාචාර්ය නන්දදස කෝදගොඩ පාසැල් දරුවන්ට දැක්වූයේ අසීමිත ආදරයකි. ඒ අයට අමතන ලද්දේ දුවේ. පුතේ යනුවෙනි. කිසිම දරුවෙක් හෝ දැරියක් ප්‍රශ්නයක් ඇසීමට බිය නොවිය. එතුමාගෙන් අසන ප්‍රශ්නයට පිළිතුරු කෙදිනකවත් නොලැබුණු අවස්ථාවක් නැත. ප්‍රශ්න විචාරාත්මක වැඩ සටහන් එතුමා මෙහෙයවූයේ එක්තරා නව නැම්මකට අනුවය. දරුවාගෙන් හෝ දැරියගෙන් ප්‍රශ්න අසන විට එය ඉතාමත් පැහැදිලිව ඇසීම මෙහි විශේෂයක් විය. එම ප්‍රශ්නය තේරුම් ගැනීමට මෙය උදව් විය.

"විදුසර" අද ජනප්‍රිය විද්‍යා පත්‍රයකි. 1987 දී එය එළිදැකීමට මූලිකව වැඩ කළ උපදේශක මණ්ඩලයේ එක් විශේෂ ක්‍රියාකාරී සාමාජිකයෙක් ලෙස මහාචාර්ය කෝදගොඩ කටයුතු කළේය.

මහාචාර්ය කෝදගොඩගේ විද්‍යාව ජනප්‍රිය කිරීමේ කාර්යය නිසා බිහිවුන එක් සංගමයක් ගැන මෙහිදී විශේෂයෙන් සඳහන් කළ යුතුය. නරේසා ආයතනය විසින් සංවිධානය කරන ලද විද්‍යා ලේඛක වැඩමුළු ගණනාවක් පවත්වන ලදී. දිවයිනේ විවිධ සන්නිවේදන වෘත්තීය ලේඛකයන් සහ ඉලෙක්ට්‍රොනික මාධ්‍යයේ තරුණ පිරිස් මෙයට සහභාගි විය. මහාචාර්ය කෝදගොඩ විසින් පසුගිය වැඩමුළුවකදී කරන ලද යෝජනාවක් අනුව මෙම සන්නිවේදකයෝ "ශ්‍රී ලංකා විද්‍යා සන්නිවේදන සංගමය" නමින් සංගමයක් පිහිටුවා ගත්හ. එම සංගමය වර්ෂ 1996 දී පිහිටුවා ගත් නමුත් අද එය දෙපයින් ගමන් කරන තත්ත්වයට පත්වී ඇත. මේ වන විට සක්‍රිය වැඩ සටහන් ගණනාවක් එම සංගමය පවත්වා ඇත. මහාචාර්ය කෝදගොඩ මෙහෙය වූ. එම සංගමය මගින් පවත්වන ලද. දිවයිනේ විවිධ පර්යේෂණ ආයතන වලින් නියෝජිතයන් සහභාගි වූ අන්තිම වැඩසටහන මේ වසර මාර්තු මාසයේ දී පවත්වන ලදී.

මහාචාර්ය කෝදගොඩ විද්‍යා සන්නිවේදනයේ යුග පුරුෂයෙක් විය. විද්‍යාව ජනප්‍රිය කිරීමට එතුමා දැල්වූ ගිණි සිළුව තවමත් දැල්වෙමින් පවතී. එය නොනිමා. දිගටම දල්වා තබා ගැනීම වත්මන් පරපුරේ කාර්යයක් වේ.




**ලක්ෂ්මී එන්. මෙනන් ජාත්‍යන්තර සම්මානය**

විද්‍යා සන්නිවේදනයේ යුග පුරුෂයකු වූ
මහාචාර්ය **කෝදගොඩ** විද්‍යාව ජනප්‍රිය කිරීමට
දැල්වූ ගිණිසිළුව තවමත් දැල්වෙමින් පවතී.
එය නොනිවා දිගටම දල්වා තබා ගැනීම
වත්මන් පරපුරේ කාර්යය වේ.

VIDUS 19-2-10

# මහාචාර්ය කෝදගොඩ සහ වෛද්‍ය විද්‍යාව


මහාචාර්ය රවීන්ද්‍ර ප්‍රනාන්දු

*ව්‍යවහාරික වෛද්‍ය අංශය*

*වෛද්‍ය පීඨය*

*කොළඹ 08.*


**දේශමාන්‍ය මහාචාර්ය නන්දදස කෝදගොඩ (එම්.බී.බී.එස්) (එම්.ඩී) (එෆ්.ආර්.සී.පී) (ඩී.එම්ජේ) එෆ්.සී.සී.පී) (එෆ්.ඇකඩ්.එස්සී) (ඩී.එස්.සී) යන වෛද්‍ය උපාධි රාශියකින් පිරිපුන් ජනප්‍රිය අග්‍රගන්‍ය විද්‍යාඥයෙකි. එසේම කායික වෛද්‍ය වරයෙකු මෙන්ම වෛද්‍ය විද්‍යාව පිළිබඳ ආචාර්ය වරයෙකි. වෛද්‍ය විද්‍යාවට විවිධ ක්ෂෙත්‍ර ඔස්සේ එතුමාගෙන් ලැබුණු දයකත්වය වසර 40 ට වඩා වැඩිවිය.**

> ***මියන්ගේ පෙනහලු වලට අහිතකර බලපෑම් ඇති කිරීමට "වීපොතු" හේතුවන බව සොයාගත් ශ්‍රී ලංකාවේ පළමුවැන්නා වූයේද කෝදගොඩ මහාචාර්ය තුමාය. එසේම ශායනික ව්‍යාධිවේදය පිළිබඳ නිර්වචනයත් ඔහුගේ පර්යේෂණ වලින් ඉදිරිපත් කිරීමටද හැකිවිය.***

වසර 1956 දී වෛද්‍ය විද්‍යාවේදී සහ ශල්‍ය වෛද්‍යවේදී උපාධිය ලැබීමෙන් පසු ඉතා කෙටි කලක් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ සේවය කළේය. ඉන් පසුව ශ්‍රී ලංකා වෛද්‍ය විද්‍යාලයේ ප්‍රසව සහ නාරිවේද වෛද්‍ය අංශයේ ලේඛකාධිකාරී ලෙස සේවය කළ අතරම වසර තුනක් එම විෂයයන් පිළිබඳව පුහුණුවක්ද ලැබීය. මෙම පුහුණුව එතුමාගේ පළමු ආදරයට පාත්‍ර වූවක් විය. හදිසි කරුණු කීපයක් නිසා ඔහුගේ මෙම ක්ෂෙත්‍රය වෙනස් කිරීමට මග පෑදුණු හෙයින් වසර 1960 දී ව්‍යවහාරික වෛද්‍ය විද්‍යා දෙපාර්තමේන්තුවේ කථිකාචාර්ය වරයෙකු ලෙස සේවයට බැඳුනේය. පසුව වැඩිදුර පුහුණුව සඳහා එඩින්බරෝ විශ්ව විද්‍යාලයට ඇතුලත් වී වසර 1964 දී අධිකරණ වෛද්‍ය විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමාවක් ද ලබාගත් අතර රාජකීය කායික වෛද්‍ය සංගමයේ සාමාජිකත්වයටද හිමිකම් ලැබීය. වසර 1965 දී මව්රටට පැමිණීමෙන් පසු ලංකා වෛද්‍ය විද්‍යාලයෙන් වෛද්‍ය විද්‍යාව පිළිබඳව ආචාර්ය උපාධිය ලබා ගත්තේය. මෙයින් වසර 8 කට පසු එනම් 1973 දී එඩින්බරෝහි රාජකීය කායික වෛද්‍ය සංගමය විසින් එහි සාමාජිකත්වය මෙතුමාට පිරිනමන ලදී. පසුව වසර 1985 දී ශ්‍රී ලංකා විද්‍යා ඇකඩමියේ සාමාජිකත්වය සහ ලංකා කායික වෛද්‍ය සංගමයේ සාමාජිකත්වයද මෙතුමාට හිමි විය. මහාචාර්ය කෝදගොඩගේ දිගුකාලීන විශ්ව විද්‍යාල සේවාව ඉතා වටිනාකමකින් යුත් සේවාවක් විය. ආචාර්යවරයෙකුට දැරිය හැකි සෑම තනතුරක්ම මෙතුමා විසින් බාරගත් අතර එමගින් වෛද්‍ය අධ්‍යාපනයට අතිවිශාල දැනුම් සම්භාරයක්ද එකතු කළේය. වෛද්‍ය පීඨයේ භාෂා අධ්‍යයන ඒකකයක් පිහිටුවා එහි ප්‍රධානියා ලෙස කටයුතු කරමින් වෛද්‍ය සිසුන්ට වෛද්‍ය විද්‍යාව සිංහල භාෂාවෙන් (ස්වභාෂාවෙන්) ඉගැන්වීමටත් කටයුතු කළ අයුරු ප්‍රශන්ශනීයය. තවද වෛද්‍ය පීඨයේ එතුමා දැරූ නීති උපදේශක, ශිෂ්‍ය උපදේශක වැනි තනතුරුද වෛද්‍ය සිසුන් සමග කිට්ටු සම්බන්ධතා ගොඩ නගා ගැනීමටද හේතු විය. දේශීය වෛද්‍ය විද්‍යාව කෙරෙහි දැක්වූ ලැදියාව නිසාම දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ අධ්‍යක්ෂ ධූරය හිමිවී තිබිණ.

කාලය ගෙවීයත්ම කෝදගොඩ මහාචාර්යතුමා ජාතික මට්ටමේ විවිධ මණ්ඩල සහ කලමණාකාරක මණ්ඩල වලටද පත් කෙරිණ. එවැනි ආයතන අතර ජාතික අධ්‍යාපන ආයතනය, ශ්‍රී ලංකා ස්වාභාවික සම්පත්, බලශක්ති හා විද්‍යා අධිකාරිය (නරේසා) මුල්තැනක් ගත් අතර ජාතික අන්තරායකාරී ඖෂධ පාලක මණ්ඩලයේ සභාපති වීම වැදගත් කාර්යයක් විය. මහාචාර්ය කෝදගොඩගේ විද්‍යාත්මක හා වෛද්‍ය ප්‍රකාශන පුළුල් පරාසයක විෂය

ධාරාවන් ආවරණය කර ඇත. එසේම එතුමා සතුවූ විවිධ විද්‍යා විෂයයන් පිළිබඳවත් හා වෛද්‍ය විද්‍යාව පිළිබඳවත් වූ දැනුම විවිධ විද්‍යාත්මක හා වෛද්‍ය විද්‍යා ග්‍රන්ථ ඔපවත් කිරීමට සමත් විය.

මියන්ගේ පෙනහලු වලට අහිතකර බලපෑම් ඇති කිරීමට "වී පොතු" හේතුවන බව සොයා ගත් ශ්‍රී ලංකාවේ පළමු වැන්නා වූයේද කෝදගොඩ මහාචාර්ය තුමාය. පළමු වරට ශායනික ව්‍යාධිවේදය පිළිබඳ නිර්වචනයන් ඔහුගේ පර්යේෂණ වලින් ඉදිරිපත් කිරීමට හැකිවිය. එතුමා විසින් කරන ලද මූලික සේවාවලින් අනර්ග සේවාවක් ලෙස මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහිවූවන් සඳහා කඳවුරු පවත්වා ප්‍රතිකාර කිරීමේ ක්‍රමය (Camp Mathod) ප්‍රධාන තැනක් ගනී. වෛද්‍ය විද්‍යාව හා සම්බන්ධ අනෙකුත් විෂයයන් සඳහා සිංහල (න්‍යායයික) වදන් එකතුවක් ලැබුණේ මහාචාර්ය කෝදගොඩ විද්වතුන් නිසයි. එලෙසම තවදුරටත් කටයුතු කරමින් වෛද්‍ය විද්‍යා පාඨග්‍රන්ථ සිංහල භාෂාවට පරිවර්තනය කළ අතර, මෙලෙසට පළකළ පළමු ප්‍රකාශනය වූයේ "පටක විද්‍යාව" නම් ග්‍රන්ථයයි. තවද එඩින්බරෝ විශ්ව විද්‍යාලයේ මහාචාර්ය "සැන්ඩි ස්මිත්" විසින් ලියන ලද Forensic Medicine) නම් ග්‍රන්ථය "වෝහාරික වෛද්‍ය විද්‍යාව" යනුවෙන් සිංහලට පරිවර්තනය කිරීම මුල්තැනක් ගනී. එතුමාගෙන් මෙසේ වෛද්‍ය ග්‍රන්ථ ප්‍රකාශනයෙහි ලා අපරිමිත සේවාවක් වූ අතර "සැක්දෙව්ගේ" ලෝක ග්‍රන්ථයට ලියන ලද " ශ්‍රී ලංකාවේ ගබ්සා කිරීම්" යන පරිච්ඡේදය නව අදහස් වලින් සමන්විත විය.

වෛද්‍ය විද්‍යා ක්ෂෙත්‍රයටත් හා විද්‍යා ක්ෂෙත්‍රයටත් එතුමාගෙන් සිදුවූ මෙහෙයට ලැබුණු ජාත්‍යන්තර පිළිගැනීමද අඩුවක් වූයේ නැත. මෙතුමා ලෝක සෞඛ්‍ය සංවිධානයේ මත්ද්‍රව්‍ය නොමනා භාවිතය (Drug Abuse) පිළිබඳ විශේෂඥ කමිටුවේ සාමාජිකයෙක් ලෙස වාර **3** ක් නොකඩවා කටයුතු කළේය. එක්සත් ජාතීන්ගේ සංවිධානයට සම්බන්ධ, නියෝජිත ආයතන වල උපදේශකයෙකු ලෙස සේවය කිරීමට ආරාධනා කළ අවස්ථා අපමණය. ලිංගික අධ්‍යාපනය පිළිබඳ ජාත්‍යන්තර කවුන්සිලය මගින් එහි සාමාජිකත්වය මෙතුමාට පිරිනැමිය. ඖෂධ පාලන ක්ෂෙත්‍රයේ කටයුතු වලට සහ කලාපයේ තරුණ සංවිධාන වලට කළ සේවය වෙනුවෙන් "ගුඩ් ටෙම්ප්ලර්ස්") ජාත්‍යන්තර සංවිධානය විසින් දෙවරක්ම ගෞරව සම්මාන පුදන ලදී. මත්ද්‍රව්‍ය පිටු දැකීම සඳහා වූ "ලක්මි එන්මෙනන්" ජාත්‍යන්තර සම්මානය ලබා ගැනීමද මෙම ක්ෂෙත්‍රයට එතුමාගෙන් ලැබුණු සේවය අගය කිරීමකි. විෂ වෛද්‍ය විද්‍යාවද එතුමාගේ දායකත්වය ලැබුණු තවත් විෂය ක්ෂෙත්‍රයක් විය. හැත්තෑව දශකයට පෙර වෛද්‍ය පීඨයේ විෂවීම් වලට ප්‍රතිකාර කිරීම සඳහා ඒකකයක් හා විෂවීම් පිළිබඳ තොරතුරු සේවාවක්ද පිහිටුවීමට සමත් විය. මෙහිදී පොදු විෂවීම් සඳහා කාඩ්-දර්ශක ක්‍රමයද හඳුන්වා දීමට මහාචාර්ය කෝදගොඩ විද්වතුන් සමත් විය.

ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමයේ ලේකම් පදවියත්, වෛද්‍ය විද්‍යා අංශයේ සභාපති පදවියත් ඉසුලූ මහාචාර්යතුමා ලංකා කායික වෛද්‍ය සංගමයේ සාමාජිකත්වයත්, ශ්‍රී ලංකා නීති වෛද්‍ය සංගමයේ ගරු ලේකම් පදවියත් ඉසිලීමට සමත් විය. විද්‍යා ව්‍යාප්ති කමිටුවේ සභාපති තනතුර හෙබවූ කෝදගොඩ මහාචාර්ය තුමා වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පාලක මණ්ඩලයේ සාමාජිකයෙකු ද විය. මේ සෑම සංවිධානයකටම සහ ආයතනයකටම වටිනා දායකත්වයක් ලබාදුන් මහාචාර්ය කෝදගොඩ ශ්‍රී ලංකාවේ වෛද්‍ය විද්‍යා අධ්‍යාපනයේ තත්ත්වය ඉහළ නැංවීමටත් වෛද්‍ය විද්‍යාවේ ප්‍රායෝගික තත්ත්වයන් දියුණු කිරීමටත් මහත් උනන්දුවකින් කටයුතු කළේය. වෛද්‍ය පීඨයේ සේවය කළ කාලය තුළ වෛද්‍ය විද්‍යා අධ්‍යාපනයේ අභිවෘද්ධිය සඳහා අතිවිශාල ක්‍රියා කාරකම් රැසක් දායාද කර දීමට මෙතුමා සමත් විය. මෙතුමාගේ දර්ශනය, හැදියාව සහ කුසලතාව සියලුම තරුණ වෛද්‍ය වරුන්ට වටිනා ආදර්ශයක්ද වනු නොඅනුමානය.




**මත්ද්‍රව්‍ය පිටු දැකීම වෙනුවෙන් ලැබූ I.O.G.T සම්මානය**

VIDUS 19-2-12

# නවකයන් සඳහා සිය දැනුම දිගුකල යුග පුරුෂයා

අමල් උඩවත්ත

පාසැල් අවධියට පෙරත්, පාසැල් අවධියේදීත්, පාසැල් අවධියෙන් පසුවත්, මේ වනතුරුත් මාගේ ගතත් සිතත් වෙලාගත් රෝගයක් විය. සිරුරට වැළදෙන අන් රෝග වලට වඩා හාත්පසින්ම වෙනස්වූ මෙම රෝගයෙන් සිරුරට මෙන්ම මනසටද කිසිදු පීඩාවක් ගෙන දුන්නේ නැත. එහෙත් දිනෙන් දින උත්සන්න වූ මේ රෝගී තත්ත්වය නිසා මා හට වෘත්තීමය වශයෙන් විද්‍යා ලේඛනයත් හා පුවත්පත් කලාවත් තෝරා ගැනීමට සිදුවිය.

අතට හසුවන සැම දෙයක්ම කියවීමේ රුචිය නැමති රෝගයෙන් පෙළුණු මගේ මෙම රෝගී තත්ත්වය දෙගුණ තෙගුණ කළ විද්වතුන් අතුරින් ප්‍රධාන වූ විද්වතුන් දෙදෙනකුද විය. ආචාර්ය ජ්.ඩබ්ලිව්. අදිකාරම් සහ මහාචාර්ය නන්දදස කෝදගොඩ යන ඒ විද්වතුන් දෙපොළයි. ආචාර්ය ජ්.ඩබ්ලිව්. අදිකාරම් සිය දර්ශනික අදහස් කියා පෑ ලිපි වලින් මා ඔහුට සමීප වුවත් ඇසුරින් සමීප වූයේ නැත. එහෙත් වරක් හෝ දෙවරක් පමණ දැක තිබුණි. එහෙත් මහාචාර්ය නන්දදස කෝදගොඩයන් සිය අදහස් කියා පෑ ලිපි වලින් පැවැත්වූ දේශන වලින් මෙන්ම ඇසුරින්ද මා එතුමාට සමීප විය.

හැටේ දශකයේත් හැත්තෑව දශකයේත් ශ්‍රී ලංකාවේ පාසැල් ළමුන් අතර ජනප්‍රිය සඟරාවක් වූ "විද්‍යා" සඟරාවේ සංස්කරණ සාමාජිකයෙකු මෙන්ම ජනප්‍රිය ලේඛකයෙකුද වූ එතුමා අපට සමීප වූයේ දෙස්තර නන්දදස කෝදගොඩ යන නමිනි. එද එතුමා වෛද්‍ය වෘත්තියේ යෙදෙමින් විද්‍යා ලේඛකයෙක් ලෙස ගැඹුරු විදු වදන් සරලව පැහැදිලි කිරීමට දැක්වූයේ අපූරු දක්ෂතාවකි. එතුමා විසින් ලියන ලද ලිපි සහිත සඟරා අදත් මා ළඟ සුරැකිව පවතී. පාසැල් අවධියේදී මිතුරන් සමඟ මා එතුමන් විසින් ලියන ලද ලිපි කියවා ලැබුවේ අපූරු ආස්වාදයකි. අසීමිත දැනුමකි.

එතුමන්ගේ ලිවීමත් සරල වුවා සේම පැවැත්වූ දේශනද සරල මට සිලිටු බසකින්ද යුක්ත විය. මනා සංයමයකින් යුක්තව ඉවසීමෙන් නිරාකරණය කළ වෛද්‍ය ගැටළු වලින් ගුවන් විදුලියත් රූපවාහිනියත් ඔපවත් විය. මේ නිසාම අගනුවර වෛද්‍ය විද්‍යාලයේ සිට ඈත බින්තැන්නේ වැදි ජනතාව දක්වා වූ සියලු ජන කොටස් මහාචාර්ය නන්දදස කෝදගොඩ වියතුන්ගේ හිතවතුන් විය.


හැටේ දශකයේත් හැත්තෑව දශකයේත්
ශ්‍රී ලංකාවේ පාසැල් ළමුන් අතර
ජනප්‍රිය සඟරාවක් වූ "විද්‍යා" සඟරාවේ
සංස්කරණ සාමාජිකයෙකු මෙන්ම ජනප්‍රිය
ලේඛකයෙකුද වූ එතුමා අපට සමීප වූයේ
දෙස්තර නන්දදස කෝදගොඩ යන නමිනි.
එද එතුමා වෛද්‍ය වෘත්තියේ යෙදෙමින්
විද්‍යා ලේඛකයෙක් ලෙස ගැඹුරු
විදු වදන් සරලව පැහැදිලි කිරීමට
දැක්වූයේ අපූරු දක්ෂතාවකි.


පාසැල් අවධියේ දී එතුමන් හා සමීප ඇසුරක් පැවැත්වීමට නොහැකි වුවත් පසුගිය අසූව දශකයේ අග භාගයේදී විද්‍යා සිසුන් කීප පොළක් එකතුවී කොළඹ ආනන්ද මහා විද්‍යාලයේදී පිහිටුවා ගත් ශ්‍රී ලංකා විද්‍යා ශිෂ්‍ය පදනම තුළින් එතුමා සමඟ විටින් විට ඇසුරු කිරීමට හැකිවීම මා ලද භාග්‍යයක්

විය. එතුමා විද්‍යා ශිෂ්‍ය පදනමේ ගරු අනුශාසක වරයෙක්ද විය. එතුමා සමග ආචාර්ය උපාලි එම්. සේනානායක, ආචාර්ය ග්‍රැන්විල් ධර්මවර්ධන, මහාචාර්ය වියුලි ද සිල්වා, මහාචාර්ය සරත් කොටගම, එඩ්වින් ආරිදස වැනි විද්වත්හු ද ගරු අනුශාසක ධූර දැරූහ. විද්‍යා ශිෂ්‍ය පදනමේ එක් සාංවත්සරික උත්සවයකදී පැවැත්වූ දේශනයක් ඇසුරින් ලිපියක් සකස් කිරීම මට අයත් වූ කාර්යභාරය විය. එදින පැවැත්වූ දේශන අතුරින් සිත්ගත් එක් දේශනයක් විය. ඒ මහාචාර්ය නන්දදස කෝදගොඩ විසින් පැවැත්වූ දේශනයයි. එතුමාගේ දේශනය හොඳින් අසා සිටි මා ඒ ඇසුරින් එදිනම රාත්‍රියේ දී ලිපිය ලියා අවසන් කළෙමි. "**නිහතමානී නොවන අය විද්‍යාඥයින් නොවේ**" යන්න එතුමාගේ දේශනයේදී කියවිනි. එම පාඨය මා විසින් සකස් කළ ලිපියේ සිරස් තලයට දමනු ලැබුවෙමි. එම ලිපිය විද්‍යා ශිෂ්‍ය පදනමේ පුවත්පත වූ "විදු පුවත්" සඟරාවේ මුල් පිටුවේම පළ විය. එවකට මා "විදු නැණ" පුවත්පතේ ආධුනික බාහිර ලේඛකයෙක්මි. ඉන් පසු දිනෙකද "විදුනැණ" පුවත් පතේද එම ලිපිය පළ විය. පලමු ලිපියත් රැගෙන මා, එහි කර්තෘ ධනසිරි බෝධිනායක මහතා සමග මහාචාර්යතුමන් හමු වීමට එතුමාගේ නිවසට ගියෙමු. එහිදී මහාචාර්ය තුමන්ට මාව හඳුන්වා දුන් බෝධිනායක මහතා මා විසින් ලියන ලද ලිපියද එතුමාගේ දැනට යොමු කළේය. මඳ වේලාවක් තුළ එම ලිපිය කියවා ලිපිය හොඳයි. මම කියපු දේවල් ලියල තියනවා. යනුවෙන් පවසා දේශනයක් කරනකොට හොඳින් අසා ඉන්න. අවශ්‍ය දේ සටහන් කරගන්න. පසුව නිදහසේ ලියන්න. එතකොට තමයි තමන්ටත් නොදැනීම හොඳ නිර්මාණයක් බිහි වන්නේ. යනුවෙන් කෙටි අවවාදයක් ද දුන්නේ අව්‍යාජ සිනහවක් මුවින් පළකරමිනි. එවකට ආධුනික විද්‍යා ලේඛකයෙකු වූ මා හට එම වදන් පෙළ ඉහළම සම්මානයක් විය. විද්‍යා ශිෂ්‍ය පදනම මෙහෙයවූ සෑම සම්මන්ත්‍රණයක් සඳහාම එතුමා නියමිත වේලාවට නොවරදවා පැමිණියේය. වෙලාවට කලින් පැමිණුනත්, වෙලාවට පසුව නම් පැමිණෙන්නේම නැත. නියමිත වේලාවට කටයුතු කිරීම එතුමාට කිසිදු අපහසුවක් නොවීය. සම්මන්ත්‍රණ වලට පැමිණීමෙන් පසු දේශනයක් පැවැත්වීම සාමාන්‍ය සිරිත විය. එහෙත් දේශනය කෙටි විය. එසේම අර්ථවත් විය. විටින්විට අපට හමුවන සෑමවිටම එතුමා කියා සිටියේ විද්‍යාව ගමට ගෙන යා යුතු බවයි. ඒ සඳහා යොදා ගත යුතු ප්‍රබලම මාධ්‍ය සිංහල භාෂාව බවත් ඉංග්‍රීසි භාෂාව පිළිබඳ දැනුම විද්‍යා දැනුම පුළුල් කිරීමට මහත් පිටුවහලක් වන බවත් එතුමා තරයේ ඇදහූ දෙයක් විය. සැබවින්ම එතුමා සිය ජීවිත කාලය පුරාම ක්‍රියා කළේ සිංහල භාෂාවෙන්, විද්‍යාව ජනප්‍රිය කරවීමටය.

පාසැලක විද්‍යා දිනය එතුමාගේ ප්‍රියතම දිනය විය. ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන් වලදී එතුමා විසින් අසන ලද ප්‍රශ්න වලින් පාඨකයා අතරමං වන්නේද නැත. බිය වන්නේද නැත. එතුමාට ආවේනික වූ ප්‍රශ්න විචාරාත්මක ශෛලියක් විය. ඕනෑම ප්‍රශ්නයක් ඇසීමට පෙර, ඔබට කියන්න පුළුවන්ද? හොඳයි ඔබ කියන්න බලන්න. යනුවෙන් පටන් ගැනීම. එතුමාටම ආවේනික වූවක් විය. කිසියම් පිළිතුරක් දීමට අසමත් වන්නෙකුට ඒ ප්‍රශ්නය පිළිබඳව වූ පිළිතුර පහසු කිරීම සඳහා ඉඟි වැකි ලබාදීම නිරතුරුවම

**පාසැලක විද්‍යා දිනය**
**එතුමාගේ ප්‍රියතම දිනය විය.**
**ඕනෑම ප්‍රශ්නයක් ඇසීමට පෙර**
**ඔබට කියන්න පුළුවන් ද. හොඳයි**
**ඔබ කියන්න බලන්න**
**යනුවෙන් අසා පටන් ගැන්ම**
**එතුමාට ආවේනික වූ**
**ලක්ෂණයක් විය.**

කරන්නකි. ලැබෙන පිළිතුර සතුටින් බාරගැනීමත් එම පිළිතුර වඩාත් හොඳින් පැහැදිලි කිරීම සඳහා කරුණු ගෙනහැර දැක්වීමද එතුමා නිරතුරු කළ දෙයක් විය. ප්‍රශ්න විචාරාත්මක වැඩ සටහනක මූලික අදහස පිළිතුරු ලබා ගැනීම වුවත්, එතුමාගේ උත්සාහය වූයේ අසන්නන් මෙන්ම පිළිතුරු දෙන්නන්ගේද දැනුම වඩාත් පෝෂණය කිරීමයි.

වසර 1995 දී ශ්‍රී ලංකා ස්වාභාවික සම්පත්, බලශක්ති හා විද්‍යා අධිකාරිය (නරේසා) විසින් මෙහෙයවූ විද්‍යා ලේඛක වැඩමුළුවකදී එතුමා අපට හමු විය. තෙදිනක් පුරා පැවති මෙම වැඩමුළුවේ දේශක විද්වතුන් අතර ප්‍රධාන විද්වතා වූයේද කෝදගොඩ වියතුන්ය. සෑම මාධ්‍ය ආයතනයක්ම නියෝජනය කරමින් විද්‍යා ලේඛකයින් රැසක්ම එම වැඩමුළුවට සහභාගි විය. වැඩමුළුව අවසන් දිනය ළඟා විය. එදින මමත්, නිහාල් පී. අබේසිංහත් මහාචාර්යතුමා හමු වී විද්‍යා ලේඛකයින්ගේ සංගමයක් පිහිටුවීමට අදහස් කරන බවත් එහි අරමුණ විද්‍යාව ජනප්‍රිය කරවීම බවත් කියා එතුමාගෙන් අවශ්‍ය උපදෙස් පැතුවෙමු. අප දෙදෙනාවත්, අපගේ අදහසුත් සතුටින් පිළිගත් එතුමා එදින සහතික පත් බෙදා දීමට පැමිණි එවකට මාධ්‍ය ඇමතිවරයාව සිටි ධර්මසිරි සේනානායක මහතාට අපගේ අරමුණත්, අදහසුත් පවසා කරුණු වැඩිදුරටත් පැහැදිලි කළේය. ඉන් සති දෙකකට පමණ පසු, මහාචාර්ය ප්‍රියානි ඊ සොයිසා, මහාචාර්ය පී.එල්.ඩී. වෛද්‍යසේකර, ආචාර්ය උපාලි එම්. සේනානායක, ආචාර්ය ජයන්ත ලාල් රත්නසේකර, අනුර සිරිවර්ධන, තුසිත මලලසේකර, බී.එම්.සී.කේ. බස්නායක සහ පර්සි ජයමාන්න යන විද්වතුන් ඉදිරියේ, "නරේසා" ශ්‍රවණාගාරයේ දී විද්‍යා ලේඛකයින් රැසකගෙන් සැදුම්ලත් ශ්‍රී ලංකා විද්‍යා සන්නිවේදක සංගමය මහාචාර්ය නන්දදස කෝදගොඩ විද්වතුන්ගේ උපදෙස් අනුව පිහිටුවීමට අපට හැකිවිය. පසුව සංගමයේ ව්‍යවස්ථාවට අවශ්‍ය කරුණු සැකසුවේද එතුමාය. සාමාජිකත්වය සඳහා වූ ඉල්ලුම් පතද සැකසුනේ එතුමාගේ අතිනි. වසරකට වඩා වැඩි වයසක් ගතවූ විද්‍යා සන්නිවේදක සංගමය සක්‍රීය සංගමයක් බවට පත් කිරීමට මුල් අඩිතාලම වැටුණේ නන්දදස කෝදගොඩ මහාචාර්යතුමන් අතින් බව කියන්නේ අසීමිත ගෞරවයකිනි. ඉන් මාස ගණනාවකට පසු දිනක පැවැත්වූ සම්මුඛ

පරික්ෂණයකට අනුව මාහට එතුමන් සංස්කරණ උපදෙස් දුන් "තරේසා" ආයතනයේ "විදුරාව" සඟරාවේ සංස්කාරක කටයුතු බාරගැනීමට සිදු විය.

මන්ද්‍රව්‍ය උවදුර එතුමා තදින්ම පිටු දැක්කේය. මත් උවදුර පිළිබඳව පාසැල් ළමුන් දැනුවත් කරමින් රටවටා ගියේය. ගුවන්විදුලිය, රූපවාහිනිය ඒ සඳහා ප්‍රබල මාධ්‍යයක් ලෙස යොද ගත්තේය. දැනුමෙන් හා හැකියාවෙන් සංකීර්ණ පුද්ගලයෙකු වුවත් සරල පැවැත්මක් අගය කළේය. සිංහල භාෂාව කෙරෙහි දැක්වූයේ අසීමිත සෙනෙහසකි. අන් භාෂාවන් කෙරෙහිද දැක්වූ සෙනෙහසද අපමණය. කුඩා වුවත් අප රට බුද්ධිමතුන්ගෙන් හා විවිධ විෂය ක්ෂේත්‍රවල නිපුණ පුද්ගලයින් ගෙන්ද අඩුවක් නැත. එක් විෂය ක්ෂේත්‍රයකට පමණක් සීමා නොවී විවිධ ක්ෂේත්‍ර ගණනාවක නිපුණ හැකියාවන් ප්‍රකට කළ එතුමා කළ කී දේ නොනැසී පැවතුනත් එතුමා අද අප අතර නැත. එතුමාගේ දර්ශනය ඉදිරියට ගෙන යාමට කෙනෙකුද නැත.



**කුඩා දරුවන් අතර පවා සරල සිංහල බසින් විද්‍යාව ජනප්‍රිය කිරීමට ගත් වෙහෙස අපමණය**

VIDUS 19-2-15

# ආයුර්වේද සහ දේශීය වෛද්‍ය ක්ෂේත්‍රයට වූ සේවාව

ආචාර්ය එස්.පී. රණසිංහ
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
කොළඹ විශ්වවිද්‍යාලය
දේශීය වෛද්‍ය විද්‍යායතනය
රාජගිරිය

ඒ. **1966** වසරෙහි ජූනි මාසයෙහි තුන්වන සතියෙහි දිනකි. රජයේ ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයෙහි ප්‍රධාන ශාලා දෙරටුව (දැනට මෙම ශාලාව දෙස්තර ආර්.බී. ලෙනෝරා ශාලාව ලෙස නම් කර ඇත.) අසල තැබුණු කළුලෑල්ලක සුදු රටහුණු කූරකින් ලියන ලද දැන්වීමෙකින් පවසා සිටියේ එදින පෙ.ව. **11.00** ට වෛද්‍ය පීඨයේ, කථිකාචාර්ය දෙස්තර නන්දදාස කෝදගොඩ මහතාගේ දේශනයක් එම ශාලාවෙහි පැවැත්වෙන බවය. විවෘත දේශනයක් වූ ඊට සහභාගි වන ලෙස විද්‍යාලයෙහි කාටත් ඇරයුම් කොට තිබුණේය. එවකට පළමුවන වසරෙහි වූ අපි නියමිත වේලාවට දේශනය පැවැත්වෙන ශාලාවට රැස්ව සිටියෙමු. හයසියයකට ආසන්නවූ වසර පහටම අයත් ශිෂ්‍ය ශිෂ්‍යාවන් ද ආචාර්ය මණ්ඩලයේ බොහෝ දෙනෙක් ද පැමිණ සිටියහ. හරියටම පෙ.ව. **10.55** ට, එවකට විද්‍යාලයේ විදුහල්පතිව සිටි සහ ආයුර්වේද කොමසාරිස් ධූරය දැරූ, පී.කේ. දිසානායක මහතා පෙරටු කොට ගත් මිටි, තරබාරු, කාලවර්ණ සිරුරින් හෙබි එහෙත් උවනතෙහි සුහදතාවයක් ද ප්‍රසන්නතාවයක් ද රැඳුණු දේශකයා ශාලාවට ඇතුළු විය.

ඒ. 1997 වසරෙහි අගෝස්තු මස 02 දින අළුයමෙහි සදහටම නෙත් පියාගත් මහාචාර්ය නන්දදාස කෝදගොඩ විද්වතාණන් මා ජීවිතයේ පළමු වරට දුටු සැටිය.

කිසිදු සටහනක් නොමැතිව, "මෘත ශරීරයක් හඳුනාගැනීම" මාතෘකා කර ගනිමින්, සිටිවනම සිටිමින් පැය 1 1/2 ක් කෝදගොඩ මහතා සිය දේශනය පැවැත්වූයේය. එද පළමු වසරෙහි සිටි මට, එතුමාගේ දේශනයේ අඩංගු වෛද්‍ය විද්‍යාත්මක කරුණු කිසිවක් අවබෝධ කිරීමට නොහැකි වූ නමුත්, අවබෝධ කර ගත් කරුණු කීපයක් ද තිබුණි.

ආයුර්වේද ක්ෂේත්‍රයෙන් පිටත එක් සහෘදයෙකු හෝ සිටින බව මට එද පසක් වූ දෙයකි. නව්‍ය වෛද්‍ය උපාධිධරයෙකු වෛද්‍ය පීඨ කථිකාචාර්ය වරයෙකු එතරම් සුගම සහ ව්‍යක්ත ලෙසත්, අපූර්ව ශෛලියකිනුත් සිංහල භාෂාව හසුරුවමින් කතා කිරීම විස්මය දනවන්නක් විය.

එද, රජයේ ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයට, ආගන්තුක දේශනයක් සඳහා ඒ පැහැබර මධ්‍යාහ්නයේ දී පැමිණි ඒ "ජූනි මනාලයා" ඉන් වසර **31** කට පසු අප සැම වෙතින් ඉවත්ව ගිය මොහොත දක්වා ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයත්, දේශීය වෛද්‍ය ක්‍රමයත් සමග ඉතා සමීපවූත්, ගැඹුරුවූත්, සුහදවූත්, අර්ථවත් වූත් සම්බන්ධතාවයක් ඇතිව සිටියේය.

ආයුර්වේද වෛද්‍ය ක්‍රමය සහ ඒ සම්බන්ධ විවිධ අධ්‍යාපන සහ සේවා ආයතන සමග ඉතා තුරුණු වියේදීම සිය සම්බන්ධතාව ගොඩ නගාගත් මහාචාර්ය නන්දදාස කෝදගොඩ විද්වතා, සිය පෞද්ගලික හෝ රාජකාරී ජීවිතයේ දී එකින් එක ලැබූ ජයග්‍රහණ හා පිළිගැනීම් මධ්‍යයේ වුවද ආයුර්වේදය හා දේශීය වෛද්‍ය ක්‍රමය වෙත පිරිනැමූ සුහදතාවය බිංදු මාත්‍රයෙකින් හෝ අඩු නොකෙළේය. ඒ වෙනුවට එම ක්ෂේත්‍රයට තමාගේ සේවය අවශ්‍ය වූ, තමාගේ උපදෙසක් පැතූ සැමවිටම සිය ස්වාධීන කල්පනයන් ඔස්සේ අපක්ෂපාතීව සිය අදහස් ගෙනහැර පෑවේය. අර්බුද නිරාකරණය කිරීමට දයක විය.

දේශීය වූ හැම දෙයක් පිළිබඳව මැ අකලංක භක්ත්‍යාදර-යෙකින් කටයුතු කළ එතුමාට, දේශීය වෛද්‍ය ක්‍රමය නොසලකා හරින්නට බැරිවීම අරුමයෙන් නම් නොවේ. වර්ෂ **1965** සිට රජයේ ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයේ ක්‍රියාත්මක වූ පාඨමාලාවට "අධිකරණ වෛද්‍ය" පිළිබඳ දේශන ද ඇතුලත් විය. අවසාන වර්ෂයේ අධ්‍යාපන පරිපාටියට ඇතුලත් වූ එම විෂය, එවකට ආයුර්වේද ක්ෂේත්‍රයට නවමු වූවක් විය. විෂයට අදළ දේශන සඳහා හා පුරා කියා පැමිණියේ නන්දදාස කෝදගොඩ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය වරයාය. තමනට ඉතා හුරු අපූර්ව ශෛලියකින්, බොහෝ විට තමන්මැ හද වඩා ගත් තාක්ෂණික වචන රාශියක් බැහැවර කරමින් එතුමානෝ වසර **25**

කටත් වඩා අධික කාලයක් රජයේ ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයේත්, එය විශ්ව විද්‍යාලයට අනුබද්ධ වූ පසු දේශීය වෛද්‍ය විද්‍යායතනයේත් එම දේශන නොකඩවා පැවැත්වූහ. දැනට එම විද්‍යායතනයෙන් වෛද්‍ය පුහුණුව ලබා වෛද්‍ය සේවය ඇතුළු විවිධ සේවා හා අධ්‍යාපන ක්ෂේත්‍රවල සේවය කරන 98% ක් ම වන විද්‍යාර්ථීන් වෝහාරික වෛද්‍ය හා වෛද්‍ය නෛතික ශාස්ත්‍රය, එතුමාගෙන් උගත්තු වෙත්. "අධිකරණ වෛද්‍යය" වෙනුවට එතුමා වර්ෂ 1966 සිටම මේ සඳහා ව්‍යවහාරයේ තැබූයේ "වෝහාරික වෛද්‍යය" යන වදනය. මේ විෂය පිළිබඳව රජයේ ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයේ දී සිංහල භාෂාවෙන් එතුමා පැවැත්වූ දේශන, පසු කලෙක එතුමා අතින් සිංහලට පරිවර්තනය වුනු, ශ්‍රීමත් සිඩ්නි ස්මිත් ගේ වෝහාරක වෛද්‍ය ග්‍රන්ථය සකස් කිරීම සඳහා මහෝපකාරී වන්නට ඇත.

බාහිර කථිකාචාර්යවරයෙකු ලෙස සේවය කරන අතරතුරදී මහාචාර්ය කෝදගොඩ මහතා.. ආයතනයේ සුභසිද්ධිය වෙනුවෙන් ශාස්ත්‍රීය කටයුතු වලින් බැහැරව ද සිය සේවාව පිරිනැමීය. ශිෂ්‍ය ප්‍රශ්න, සුභසාධක කටයුතු ආදී ක්ෂේත්‍ර වලදී ආයතනයේ පරිපාලනය නිතරම එතුමන්ගේ උපදෙස් බලාපොරොත්තු විය. දේශීය වෛද්‍ය විද්‍යායතනයේ අධ්‍යාපන තත්ත්වය නංවාලීමට අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා පත් කෙරුණු විවිධ කමිටු වලට එතුමා අනිවාර්යයෙන්ම පත්වන සාමාජිකයෙකු විය. මෙරට පමණක් නොව විදෙස් රටවල් වලද විශ්වවිද්‍යාල ඇසුරු කර ඒවායේ කාර්ය පටිපාටිය, දර්ශනය සහ පුරුෂාර්ථ පිළිබඳ මනා අවබෝධයක් එක් අතෙකිනුත් පෙරදිග රටවල ඉතා ඈත අතීතයේ සිට පැවති සරසවිවල තත්ත්වයන් අධ්‍යාහාරයෙන් අනෙක් පසිනුත් දැන සිටි. ඒ පිළිබඳ තුල්‍යවූ මානසික දෘෂ්ඨියකින් යුතුව සිටි එතුමා, එවකට විශ්වවිද්‍යාල ක්ෂේත්‍රයෙහි ළදරු වියේ පසුවූ ආයතනය හැඩගැස්වීමේලා පුරෝගාමී වූ සේවාවක් සැපයීය.




කලාපීය තරුණ කටයුතු සඳහා වූ
**IOGT සම්මානය**

වර්ෂ 1988 සිට 1995 ජනවාරි මාසය දක්වාවූ කාලය තුළ, මහාචාර්ය නන්දදස කෝදගොඩ මහතා වෛද්‍ය පීඨයේ පීඨාධිපති වශයෙන් කොළඹ විශ්ව විද්‍යාලයේ, දේශීය වෛද්‍ය විද්‍යාලයේ කළමනාකාර මණ්ඩලයේ සාමාජිකයෙකු වශයෙන් සහභාගි විය. අනතුරුව 1995 ජනවාරි මස සිට එතුමා අභාවප්‍රාප්ත වනතුරුම, එම කළමනාකාර මණ්ඩලයේම පත්කළ සාමාජිකයෙකු ලෙස අති විශිෂ්ඨ සේවාවක් ඉටු කර ඇත. මේ සා දීර්ඝ කාලයක් පුරා එතුමා සහභාගි වූ කළමනාකාර මණ්ඩල රැස්වීම් වාර්තා නිරීක්ෂණය කරන විට, පොදුවේ ආයුර්වේද හා දේශීය වෛද්‍ය ක්‍රමය පිළිබඳවත් විශේෂයෙන්ම දේශීය වෛද්‍ය ක්‍රමය පිළිබඳවත් විශේයෙන්ම දේශීය වෛද්‍ය විද්‍යායතනය වෙතත් එතුමා තුළ බලපෑ ආකල්ප සහ හැඟුම් මොනවට පැහැදිලි වෙයි. මෙම වෛද්‍ය ක්‍රමයේ අගය වටහා ගත් එතුමා අවශ්‍ය අවස්ථාවන්හි දී නව්‍ය විද්‍යාවේ හා තාක්ෂණයේ ද උපකාර ලබමින් නව්‍ය පරිපාලන ක්‍රම ආයතනයේ පරිපාලනය සඳහාද යොදා ගනිමින්, අනන්‍යතාවයන් හා පුරුෂාර්ථද රැක ගනිමින් දියුණුවිය යුතු බව නිතරම කල්පනා කළේය. ඒ අනුව අදහස් පැවසීය. ඒ අනුව ක්‍රියාත්මකද විය.

වර්ෂ 1996 වැනි ඉතා මෑත අවධියකදී, දේශීය වෛද්‍ය විද්‍යායතනයේ කාර්ය සාධනීය ශක්තිය අභිවර්ධනය කිරීම සඳහා පත් කෙරුණු කමිටුවේ සභාපති ලෙස පත්වූ එතුමා, ක්‍රමයෙන් පැන නැගී ආ සිය රෝගී තත්ත්වය මධ්‍යයේ වුවද එහි කාර්යයන්හි නිමාව දක්වාම මෙහෙය විය. එම භාරදූර කාර්යය සඳහා තිබිය යුතු ආයතනීය අධ්‍යයන-අනධ්‍යයන සේවා තත්ත්වයන් පිළිබඳ යථාර්ථවාදී දැනුම එතුමාට ලබාගත හැකි වූයේ වර්ෂ 1983 සිට 1984 දක්වා එතුමා දේශීය වෛද්‍ය විද්‍යායතනයෙහි වැඩ බලන අධ්‍යක්ෂ ලෙස සේවය කළ කාලය තුළදී ආයතනය වෙනුවෙන් සහභාගි වූ විවිධ උත්සව සහ රැස්වීම් වලදීද, විවිධ නියෝජන වලදීද, දේශීය හා ආයුර්වේද ක්‍රම පද්ධතිය පිහිටා තිබූ දර්ශනය හා සාරධර්ම පිළිබඳව එතුමා තුළ තිබූ අපක්ෂපාතී වූත්, විවේචනාත්මක වූත් එහෙත් සාධනීය වූත් ආකල්ප පිළිබිඹු විය. පෙරදිග වෛද්‍ය ක්‍රම පිළිබඳව අස්ථාන විවේචනයක් බලාපොරොත්තුවෙන් ඒ පිළිබඳව විමසුවන්ට එතුමා පැවසුයේ, "ආයුර්වේද වෛද්‍ය ශාස්ත්‍රය

පැවසුයේ. "ආයුර්වේද වෛද්‍ය ශාස්ත්‍රය මා හිසිදක විධිමත්ව හදරා හෝ ප්‍රගුණ කර නැහැ. ඒ නිසා ඒ පිළිබඳව විමසිය යුත්තේ මගෙන් නොවෙයි. එය මනාව හැදෑරුවකුගෙන්ම ඒ පිළිබඳව විමසන්න" කියා ය. ශාස්ත්‍රීය නෛපුණ්‍යත්වය හා පටුත්වය පමණක් නොව සැබෑ මානව හිතවාදීත්වයක් සහිතවද, අනවශ්‍ය ඝෝෂාකාරී අරගල වලින් වියුක්තව විසීමේ සහජාශාවක් ද තිබූ එතුමාගේ සේවය වර්ෂ 1997 දී වෙනත්ම අයුරකින් දේශීය වෛද්‍ය විද්‍යායතනය බලාපොරොත්තු විය. එය නම්, ආයතනයේ ශිෂ්‍ය දෙපිරිසක් අතර හටගත් අර්බුදයක් විසඳීම සඳහා පත් කෙරුණු සමථ මණ්ඩලයෙහි සභාපති ලෙස එතුමා සේවය පැතීමයි. ඒ එම වසරෙහි මාර්තු මස 24 වනද ය. ඒ වන විට එතුමා තුළ පැන නැගී තිබූ බරපතල රෝගී තත්ත්වය වෙන කා හට රහසක් වුවද එතුමාට නම් රහසක් නොවීය. එහෙත්, ආයතනයේ පැවැත්මට බාධකයක්ව වර්ධනය විය හැකි එම තත්ත්වය විසඳනු පිණිස එතුමාගේ ජීවිතයේ අවසාන මාස කීපයද ගෙවී යන්නට ඇත.

මෙලෙස, වර්ෂ 1966 දී ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයට ආගන්තුක ලෙසින් ඒ පැහැබර මධ්‍යාහනයේ පැමිණි සහෘදයා, හිතවතා සහ තාරුණ්‍යයෙන් හෙබි විද්වතා ඉන් 31 වසරකට පසු එක් දිනෙක අරුනළු නැගෙන පැයේදී අපෙන් සමු ගත්තේය.

දේශීය හා ආයුර්වේද ක්ෂෙත්‍රයෙහි ඔබ ඉටු කළ සේවාව අප අගය කරමු. ඔබ තුළවූ විද්‍යා ඥානය මතු නොව ආකර්ශනීය වූ අපක්ෂපාත වූ සිතිවිලි ද මානව හිතවාදීත්වයද අප හැඳින්නෙමු. ඔබ වියෝවෙන් අපට සැබෑ සහෘදයෙකු සදහටම අහිමි විය.

නන්දදාස කෝදගොඩ මහාශයාණෙනි,
ඔබට නිවන් සුව !



vidus 19-2-18

# අරුම පුදුම රතු සෛල

"1968 විද්‍යා සඟරාව 2 කාණ්ඩය ii කලාපය"- සඳහා
***මෙම ලිපිය මහාචාර්ය තත්දදස කෝදගොඩ විද්වතුන් විසින් ලියන ලද්දකි.***



සෛලය යනු, ශරීරයේ ඉන්ද්‍රියයන් සමන්විතව ඇති ඒකකය බව ඔබ දනිති. ඉන්ද්‍රියයන් සෑදී ඇත්තේ මෙම සෛල එකිනෙක හා සම්බන්ධ වන අයුරෙන් බැඳීමෙනි. සාමාන්‍ය වශයෙන් කියත හොත්, මෙම එක් සෛලයක් වෙන්කොට ගත් විට, එය මිය යනු ඇත. ඉන්ද්‍රියයක සෛල ජීවත්ව පවත්නේත්, ක්‍රියා කරනුයේත් සමූහයක් වශයෙන් එක්ව බැඳී සිටය.

මෙම සාමාන්‍යයට බොහෝ දුරට අනුකූල නොවී පවත්නා වැදගත් සෛල විශේෂයක් ශරීරයේ වෙයි. ඒ, රක්තානු යන නමින් හැඳින්වෙන රතු රුධිර සෛල වෙයි.

රුධිරය සමන්විතව ඇත්තේ, ලවණ සහ ප්‍රෝටීන් ද්‍රාවණයෙක පා වෙමින් පවත්නා සෛල වර්ග කීපයෙකිනි. රුධිරයේ ඇති මෙම සෛල වර්ග අතුරින් ඉතා බහුල වන්නේත්, ඉතා වැදගත් වන්නේත් රතු සෛලයි. රුධිරයට රතු පැහැයක් ලැබීමට හේතු වන්නේත් මෙම රක්තාණු මය.

රුධිර ඝන මිලිමීටරයෙක රතු සෛල $5 \times 10^6$ ක් පමණ වෙයි. රතු සෛලයක ප්‍රමාණය මින් වැටහෙනු ඇත. ඇත්තවශයෙන්ම, රතු සෛලයක විශ්කම්භය, මිලිමීටරයෙකින් දහසෙන් පංගු 7.2 ක් පමණ වෙයි. රක්තාණුවක් කොතරම් කුඩාද යනු මින් වටහා ගත හැකිය.

එක් එක් රක්තාණුවක් කුඩා වුවද, ශරීරයෙහි ඇති මුළු රුධිර ප්‍රමාණයෙහි අන්තර්ගත රතු සෛල සංඛ්‍යාව අති විශාල වේ. ඝන මිලි මීටරයක කෝටි පහ ගණනේ, ශරීරයෙහි ඇති රුධිර ලීටර හයෙහි,රතු සෛල $3 \times 10^{13}$ ක් තිබිය යුතුවේ. මෙම රක්තාණු සංඛ්‍යාව රුධිර තරලයෙන් ඉවතට ගෙන, එක් පෙළකට සිටින සේ තැබුවහොත්, එම පේළිය අජටාකාශය තෙක් විහිදෙනු ඇත.

ශරීරයේ ඇති සියළුම සෛල තුළ, න්‍යෂ්ඨිය නමින් හැඳින්වෙන්නාවූ, ජීවන කේන්ද්‍රස්ථානයක් වෙයි. මෙම

කේන්ද්‍රස්ථානය නොමැතිව සෛලයකට ජීවත් විය නොහැකිය. න්‍යෂ්ඨියේ බලපෑම නොමැතිව සෛලයකට ක්‍රියා කළ නොහැකිය. එහෙත් රතු සෛලය මෙම නියමයට හාත්පසින්ම විරුද්ධ වෙයි. මනුෂ්‍යයාගේ රතු සෛලයෙහි න්‍යෂ්ඨියක් නොමැත්තේය. පරිනත නොවූ රක්තාණුවෙහි න්‍යෂ්ටියක් තිබී, සෛලය මේරීමත් සමග එය නැතිව යෙයි. එසේ වුවද, රක්තාණුව තරම් සජීව, එතරම් ක්‍රියාකාරිත්වයෙන් අනූන තව එකද හෝ සෛල ගණයක් ශරීරයෙහි නොමැති තරම් යයි කිව හැකිය.

සියළු සත්ත්වයන්ගේම රතු සෛල එක හා සමාන නොවේ. හැඩයේ ඇති මෙම වෙනස කොතරම් දුරට ලාක්ෂණික දැයි කිව හොත්, අන්වීක්ෂයක ආධාරයෙන් රතු සෛල කීපයක් පමණක් පරීක්ෂා කිරීමෙන්, එම රුධිර කවර සත්ත්ව විශේෂයකට අයත් දැයි පවා කිව හැකිවේ.



## දෙස්තර
# තන්දදස කෝදගොඩ

මනුෂ්‍ය රුධිරයෙහි ඇති රක්තාණුව වටකුරු දේහයකි. එය පැතලිය: මැදින් තුනීය. එහි හැඩය මෙසේ වුවද, එයට සිහින් නාලයක් ඔස්සේ වුවද මිරිකී තෙරපී යා හැකි වෙයි.

රතු සෛලයෙහි හැඩය රඳා ඇත්තේ එය තුළ තිබෙනා සැකිල්ලක් හා එය වටා ඇති පටලයක් ද හේතු කොට ගෙන වේ. මෙම සෛල පටලයෙන් වටවී ඇති රක්තාණුව තුළ ප්‍රෝටීන්ද, නොයෙක් ලවණ වර්ගද, ඉතා වැදගත් වර්ණකයක් වන හිමෝග්ලෝබින් නැමැති ද්‍රව්‍යයද වෙයි. රුධිරයෙන් සිදුවන ඉතා වැදගත් ක්‍රියාව වන, අම්ලකර වායුව පෙනහැල්ලේ සිට විවිධ ඉන්ද්‍රිය කරා ගෙන යාම කරනු ලබන්නේ මෙම හිමෝග්ලොබින්වල ආධාරයෙනි. රක්තානුව තුළ ඇති ලවණ වර්ගවල සාන්ද්‍රණය නොවෙනස්ව පවත්වා ගැන්ම අත්‍යවශ්‍ය වෙයි. මේ සඳහා බෙහෙවින් උපකාරී වන්නේ සෛලය වටා ඇති පටලයයි.

සෛල තුළ ඇතැම් ලවණ වර්ග එක්රැස් වන්නට පටන් ගත හොත්, සෛල පටලය ලවණ පොම්පයක් මෙන් ක්‍රියා කරමින්, ඒ අධික ලවණ ප්‍රමාණය ඒ තුළින් පිටකර හරියි. යම් අයුරෙකින් රක්තානුව තුළ ඇති සෝඩියම් ප්‍රමාණය සාමාන්‍ය ප්‍රමාණය ඉක්මවා ගිය හොත්, එය පිපිරී යන්නට පවා පිළිවන.

රක්තානුවේ සාමාන්‍ය පැවැත්ම සඳහා, එය වටා ඇති තරලයේ ලවණ සාන්ද්‍රණයද වැදගත් වේ. එම තරලයේ සාන්ද්‍රණය අධික වුවහොත්, සෛලය හැකිලී යයි. එය තනුක වුවහොත්, රක්තානුව තුළට තරලය උරා: එය පිම්බී, අවසානයේ දී පුපුරා යයි.

කෙතරම් කුඩා වුවද, රක්තානුවක් තුළ සිදුවන්නාවූ රසායනික ක්‍රියාවලි අනන්තය. ඒ තුළ ක්‍රියාත්මක වන්නාවූ එන්සයිම වර්ග අප්‍රමාණය. අප ජීවිතය රඳා පවත්නේ මෙම සූක්ෂම රසායන ක්‍රියා මත බව මෙනෙහි කිරීම බිය ගෙන දෙන්නක් නොවේද?

රතු සෛල නිෂ්පාදනය සිදු වන්නේ අක්මාව සහ පිලාව යන ඉන්ද්‍රියයන්හි සහ ඇට මිදුළු වලය. එහෙත්, යමෙක් නව අවධිය පසු කරන්ම, රක්තාණු නිෂ්පාදනය ඇට මිදුළුවලට පමණක් සීමාවේ. සතකුගේ ඉළ ඇටයක් හෝ කොඳු ඇටයක් හෝ ගෙන කපා බැලූ විට, එහි මැද රතට හුරු ද්‍රව්‍යයකින් පිරී තිබෙනු පෙනෙන්නේ මේ හේතුවෙනි.

බිළිඳු වියෙහිදී ශරීරයෙහි ඇතිවන රක්තාණු සදකල්ම පවතිනු නොවේ. එක් රතු සෛලයක් වැඩි වශයෙන්ම පවත්නේ දෙතුන් මසක් පමණි. ඉන්පසු එය බිඳී යෙයි. එහි අන්තර්ගත ද්‍රාවණය සෛල සාධනය සඳහා යෙදේ. මේ නයින් සලකා බැලූ විට, දිනපතා අප ඇට මිදුලු තුළින් රක්තාණු කොතරම් සංඛ්‍යාවක් නිපැදී පිට වෙත්දැයි ඔබට වටහා ගන්නට හැකිවනු ඇත.

රක්තාණුවක අන්තර්ගත විවිධ ද්‍රව්‍ය ගැන සිත යොමු කළ විට, රක්තාණු නිෂ්පාදනය සඳහා කොතෙක් දෑ අවශ්‍ය දැයි පෙනෙනු ඇත. එහෙත්, මින් බොහෝ දෑ අවශ්‍ය වනුයේ අල්ප මාත්‍ර වශයෙන් පමණි. රතු සෛල සෑදීම සඳහා සෑහෙන ප්‍රමාණයක් අවශ්‍ය වන්නේ ප්‍රෝටීන් ධාතු සහ යකඩද වේ. මෙම දෙවර්ගය අඩු වීමෙන් සෛල සෑදීම - සංඛ්‍යාව - අඩුවනු ඇත. යකඩ පදර්ථය අඩු වීමෙන් තවද ඌණතාවක් වේ. හිමොග්ලොබින් සාධනය සඳහා යකඩ අත්‍යාවශ්‍යය. එබැවින් ශරීරයට යකඩ මඳ වුවහොත්, රතු සෛල සාමාන්‍ය ප්‍රමාණය තිබුණද, ඒවායේ හිමොග්ලොබින් සාන්ද්‍රණය අඩු වනු ඇත. එසේ වූ රක්තාණු අඩපන වූ ඒවාය: ක්‍රියාත්මක භාවයෙන් හීනවූ ඒවාය. තිරක්තිය (anaemia) යනුවෙන් හැඳින්වෙන තත්ත්ව අතුරින් එකක් මෙයයි.

මෙතරම් කුඩා රක්තාණුවකින් ශරීරයට ඇති ප්‍රයෝජන විශ්මය ජනකය. සත්ත්වයකු කරන්නාවූ සියළු දස්කම් සැබවින්ම කරනුයේ ඔහුගේ රතු සෛල යැයි කිව, ඒ බොරු නොවේ.

VIDUS 19-2-20

## තත්දදස කෝදගොඩ මහාචාර්ය තුමන්ගේ ජීව දත්ත සටහන සහ එතුමන් ලැබූ සම්මාන

**නම** නන්දදස කෝදගොඩ

**ලිපිනය** 410/113, බෞද්ධලෝක මාවත, කොළඹ 07.

**ජාතිය** ශ්‍රී ලාංකික

**ආගම** බුද්ධාගම

**උපන් දිනය** 1929 නොවැම්බර් 02 දින

විවාහකයා

**ලබාගත් උපාධි** M.B.BS, MD, FRCP, DMJ, F.CCP, F.Acad, Sc., D.Sc

ලංකා කායික වෛද්‍ය විද්‍යාලයේ සාමාජික ශ්‍රී ලංකා විද්‍යා ඇකඩමියේ සාමාජික.

**දැරූ තනතුරු** ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨයේ පීඨාධිපති සහ වෝහාරික හා විෂ වෛද්‍ය විද්‍යාව පිළිබඳ මහාචාර්ය, කොළඹ විශ්ව විද්‍යාලයේ උප කුලපති.

ජාතික අන්තරාකාරී ඖෂධ පාලක මණ්ඩලයේ සභාපති.

**වෙනත් තනතුරු**

* පෝරුට් හි මද්‍යසාර සහ ඖෂධ තොරතුරු මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපති.
* ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී (Madical Reserve)
* ජාතික අධ්‍යාපන ආයතනයේ පාලක මණ්ඩල සාමාජික
* වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතන පාලක මණ්ඩලයේ සාමාජික
* දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ පාලක මණ්ඩලයේ සාමාජික
* ශ්‍රී ලංකා ස්වාභාවික සම්පත්, බලශක්ති හා විද්‍යා අධිකාරියේ (නරේසා) පාලක මණ්ඩල සාමාජික

### ලැබූ ජාතික සම්මාන

* දේශීය කලාවටත් සංස්කෘතියටත් කළ සේවය වෙනුවෙන් 1987 වසරේ කලා කීර්ති ජනාධිපති සම්මානය ලැබීම.
* ක්ෂේත්‍ර අධ්‍යාපනය සඳහා කළ මෙහෙය වෙනුවෙන් සිංහ රත් පදක්කම දිනා ගැනීම.
* විද්‍යාව ජනප්‍රිය කිරීම උදෙසා කාලිංග සම්මානය සඳහා නම යෝජනා කිරීම.
* විද්‍යාව ජනප්‍රිය කරවීමේලා වූ දයකත්වය සඳහා ජාතික විද්‍යා පදනම් සම්මානය ලැබීම
* ශ්‍රී ලංකා විද්‍යා ශිෂ්‍ය පදනම මගින් විද්‍යාව ජනප්‍රිය කරවීමේලා වූ දයකත්වය සඳහා සම්මාන පිරිනැමීම.

### අන්තර් ජාතික සම්මාන

වසර 1992 දී මත්ද්‍රව්‍ය පිටු දැකීම වෙනුවෙන් කළ මෙහෙය සඳහා "**ලක්ෂ්මී එන්. මෙනන්**" ජාත්‍යන්තර සම්මානය ලැබීම.